| වැය විෂය | අමාත්‍යාංශ/ දෙපාතර්මේන්තු | වියදම් වගර්ය | ලැබූ ප්‍රතිපාදන (රු.) | සත්‍ය වියදම (රු) | ඉතිරිය<br>Rs | උපයෝජනය % |
|---|---|---|---|---|---|---|
| 118-01-31-0-1001 | | පුනරාවතර්න | 1,191,464.00 | 1,189,503.00 | 1,961.00 | 100 |
| 118-01-31-0-1003 | | පුනරාවතර්න | 524,400.00 | 505,800.00 | 18,600.00 | 96 |
| 118-01-31-0-1101 | | පුනරාවතර්න | **12,000.00** | - | **12,000.00** | - |
| 118-01-02-0-1001 | | පුනරාවතර්න | 13,904,400.00 | 13,546,666.67 | 357,733.33 | 97 |
| 118-01-02-0-1003 | | පුනරාවතර්න | 6,383,680.00 | 6,165,391.61 | 218,288.39 | 97 |
| 118-01-02-0-1002 | | පුනරාවතර්න | 20,000.00 | - | 20,000.00 | |
| 118-01-02-0-1101 | | පුනරාවතර්න | 60,000.00 | 7,420.00 | 52,580.00 | 12 |
| 118-01-02-0-1201 | | පුනරාවතර්න | 87,000.00 | 86,852.34 | 147.66 | 100 |
| 118-01-02-0-1402 | | පුනරාවතර්න | 87,331.00 | 71,685.88 | 15,645.12 | 82 |
| 118-01-02-0-1409-140 | | පුනරාවතර්න | 75,000.00 | 35,760.00 | 39,240.00 | 48 |
| 118-01-01-0-1001 | | පුනරාවතර්න | - | - | - | - |
| 118-01-01-0-1003 | | පුනරාවතර්න | - | - | - | - |
| 118-01-02-1202-009 | කෘෂිකමර්, පශු සම්පත්, ඉඩම් හා වාරිමාගර් අමාත්‍යාංශය | පුනරාවතර්න | 80,000.00 | 59,943.00 | 20,057.00 | 75 |
| 118-01-02-0-1403 | | පුනරාවතර්න | 36,500.00 | 19,630.00 | 16,870.00 | 54 |
| 118-02-03-020-2202 | | ප්‍රාග්ධන | ,181,000.00 | 1,025,845.0 | 155,155.00 | 87 |
| 118-02-34-0-1002 | | පුනරාවතර්න | 368,957.00 | 205,954.65 | 163,002.35 | 56 |
| 118-02-34-0-1101 | | පුනරාවතර්න | 1,047,000.0 | 889,345.50 | 157,654.50 | 85 |
| 118-02-34-0-1201 | | පුනරාවතර්න | 74,700.00 | 66,000.00 | 8,700.00 | 88 |
| 118-02-34-0-1202-009 | | පුනරාවතර්න | 939,102.00 | 271,118.00 | 667,984.00 | 29 |
| 118-02-34-0-1301 | | පුනරාවතර්න | 255,000.00 | 56,192.50 | 198,807.50 | 22 |
| 118-02-34-0-1402 | | පුනරාවතර්න | 96,000.00 | 54,219.85 | 41,780.15 | 56 |
| 118-02-34-0-1403 | | පුනරාවතර්න | 102,800.00 | 87,464,19 | 15,335.81 | 85 |
| 118-02-34-0-1409-140 | | පුනරාවතර්න | 537,290.00 | 406,775.00 | 130,515.00 | 76 |
| 118-2-32-2-2105 | | ප්‍රාග්ධන | 2,904,747.93 | 2,059,984.93 | 844,800.00 | 71 |
| 118-01-02-0-2401 | | ප්‍රාග්ධන | 41,140.00 | 40,700.00 | 404.00 | 99 |
| 118-02-03-071-2202 | | ප්‍රාග්ධන | 13,935,600.0 | 1,400,712.50 | 12,534,887.50 | 10 |
| 118-02-03-094-2509 | | ප්‍රාග්ධන | 6,578,915.43 | 6,502,199.83 | 76,715.60 | 99 |
| 118-01-02-0-1301 | | පුනරාවතර්න | 68,650.00 | 68,650.00 | - | 100 |
| 118-02-34-0-2003 | | ප්‍රාග්ධන | 299,000.0 | 299,000.00 | - | 100 |
| එකතුව | | | **50,891,714.36** | **35,122,814.45** | **15,768,899.91** | |
| 123-02-15-08-2202 | නාගරික සංවධර්න ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය | ප්‍රාග්ධන | 464,622,101.94 | 436,605,470.54 | 28,016,631.40 | 94 |
| 123-02-15-08-2509 | | ප්‍රාග්ධන | 86,015,896.83 | 85,408,401.13 | 607,495.70 | 99 |
| එකතුව | | | **550,637,998.77** | **522,013,871.67** | **28,624,127.10** | |
| 124-2-03-0-1001 | ග්‍රාමීය සංවධර්න, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | පුනරාවතර්න | 3,025,217.00 | 2,692,951.00 | 332,266.00 | 89 |
| 124-2-03-0-1003 | | පුනරාවතර්න | 1,373,100.00 | 1,243,000.00 | 130,100.00 | 91 |
| 124-2-03-0-1101 | | පුනරාවතර්න | 72,000.00 | 68,640.00 | 3,360.00 | 95 |
| 124-2-03-0-1201 | | පුනරාවතර්න | 7,200.00 | 7200.00 | - | 100 |
| 124-2-05-001-2202 | | ප්‍රාග්ධන | 9,772,400.00 | 9,683,519.62 | 88,880.38 | 99 |
| 124-2-03-007-2509 | | ප්‍රාග්ධන | 160,000.00 | 160,000.00 | - | 100 |
| 124-02-03-14-2509 | | ප්‍රාග්ධන | 158,000.00 | 153,000.00 | 5,000.00 | 97 |
| එකතුව | | | **14,567,917.00** | **14,008,310.62** | **559,606.38** | |

| වැය විෂය | අමාත්‍යාංශ/ දෙපාතර්මේන්තු | වියදම් වගර්ය | ලැබූ ප්‍රතිපාදන (රු.) | සත්‍ය වියදම (රු) | ඉතිරිය (රු.) | උපයෝජනය % |
|---|---|---|---|---|---|---|
| 126-1-18-0-1101 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අමාත්‍යාංශය | පුනරාවතර්න | 345,600.00 | 252,119.78 | 93,480.22 | 73 |
| 126-1-18-0-1201 | | පුනරාවතර්න | 52,000.00 | 46,998.68 | 5,001.32 | 90 |
| එකතුව | | | **397,600.00** | **299,118.46** | **98,481.54** | |
| 130-1-16-0-1001 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | පුනරාවතර්න | 1,752,000.00 | 1,688,578.39 | 63,421.61 | 96 |
| 130-1-16-0-1003 | | පුනරාවතර්න | 1,034,400.00 | 996,335.48 | 38,064.52 | 96 |
| 130-1-16-0-1203-002 | | පුනරාවතර්න | 16,000.00 | 8,000.00 | 8,000.00 | 50 |
| 130-1-16-0-1205 | | පුනරාවතර්න | 100,000.00 | 99,876.00 | 124.00 | 100 |
| 130-1-16-0-1402 | | පුනරාවතර්න | 122,000.00 | 87,937.32 | 34,062.68 | 72 |
| 130-1-16-0-1403 | | පුනරාවතර්න | 1,020,000.00 | 523,341.60 | 496,658.40 | 51 |
| 130-1-16-0-1409-140 | | පුනරාවතර්න | 100,000.00 | 98,405.00 | 1,595.00 | 98 |
| 130-01-16-0-1303 | | පුනරාවතර්න | 100,000.00 | 100,000.00 | - | 100 |
| 130-01-16-0-1302 | | පුනරාවතර්න | 26,700.00 | 26,700.00 | - | **100** |
| 130-01.16-0-2001 (41) | | ප්‍රාග්ධන | 10,261,600.00 | 8,232,261.97 | 2,029,338.03 | 80 |
| 130-1-2-0-2401 | | ප්‍රාග්ධන | 149,030.00 | 142,592.89 | 6,437.11 | 96 |
| 130-01-16-0-1101 | | පුනරාවතර්න | 19,760.00 | 16,708.00 | 3,052.00 | 85 |
| එකතුව | | | **14,701,490.00** | **12,020,736.65** | **2,680,753.35** | |
| 149-01-18-0-1001 | කමර්ාන්ත හා ව්‍යවසාය සංවධර්න අමාත්‍යාංශය | පුනරාවතර්න | 2,543,299.64 | 2,543,299.64 | - | 100 |
| 149-01-18-0-1003 | | පුනරාවතර්න | 1,057,800.00 | 1,014,999.80 | 42,800.20 | 96 |
| 149-01-08-0-1101 | | පුනරාවතර්න | 4,800.00 | - | 4,800.00 | - |
| 149-01-18-0-1201 | | පුනරාවතර්න | 4,800.00 | 3,000.00 | 1,000.00 | 75 |
| 149-1-19-0-1101 | | පුනරාවතර්න | 355,000.00 | 289,099.91 | 45,900.99 | 86 |
| 149-02-20-0-1201 | | පුනරාවතර්න | 74,873.00 | 74,873.00 | - | 100 |
| 149-02-20-0-1402 | | පුනරාවතර්න | 70,246.00 | 68,764.11 | 1,481.89 | 98 |
| 149-02-20-0-1403 | | පුනරාවතර්න | 140,612.50 | 68,485.11 | 72,127.39 | 49 |
| 149-02-20-0-1405 | | පුනරාවතර්න | 90,200.00 | 79,791.60 | 10,408.40 | 88 |
| 149-02-20-0-1409-140 | | පුනරාවතර්න | 57,915.06 | 57,127.50 | 787.56 | 99 |
| 149-02-20-0-1101 | | පුනරාවතර්න | 746,400.00 | 453,247.15 | 293,152.85 | 61 |
| 149-02-20-01-2202-026 | | ප්‍රාග්ධන | 2,466,000.00 | 1,936,234.08 | 529,765.92 | 79 |
| 149-2-3-001-1001 | | පුනරාවතර්න | 1,392,846.00 | 1,392,846.00 | - | 100 |
| 149-2-03-001-1003 | | පුනරාවතර්න | 506,660.00 | 506,660.00 | - | 100 |
| 149-01-19-0-1201 | | පුනරාවතර්න | 20,500.00 | 15,500.00 | 5,000.00 | 76 |
| 149-01-20-0-2401 | | ප්‍රාග්ධන | 250,000.00 | 70,870.00 | 179,130.00 | 28 |
| 149-02-03-01-1409-140 | | පුනරාවතර්න | 35,045.00 | 35,045.00 | - | 100 |
| 149-2-20-0-1409-138 | | පුනරාවතර්න | 21,434.70 | 21,434.70 | - | 100 |
| 149-2-20-0-1404 | | පුනරාවතර්න | 54,000.00 | 54,000.00 | - | 100 |
| 149-02-20-0-1002 | | පුනරාවතර්න | 158,150.00 | 63,670.94 | 94,479.06 | 40 |
| 149-02-20-0-1303 | | පුනරාවතර්න | 990,000.00 | 855,984.63 | 134,015.37 | 86 |
| 149-02-03-048-2202 | | ප්‍රාග්ධන | 7,800,000.00 | 7,600,000.00 | 200,000.00 | 97 |
| 149-1-19-001-2509-093 | | ප්‍රාග්ධන | 55,000.00 | 55,000.00 | - | - |
| එකතුව | | | **18,874,781.90** | **17,259,932.27** | **1,614,849.63** | |
| 151-02-03-56-2202 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | ප්‍රාග්ධන | 28,620.00 | 28,620.00 | - | 100 |
| එකතුව | | | **28,620.00** | **28,620.00** | | **100** |

| වැය විෂය | අමාත්‍යාංශ/ දෙපාතර්මේන්තු | වියදම් වගර්ය | ලැබූ ප්‍රතිපාදන (රු.) | සත්‍ය වියදම (රු) | ඉතිරිය රු. | උපයෝජනය % |
|---|---|---|---|---|---|---|
| 160-01-02-1001 | පරිසර අමාත්‍යාංශය | පුනරාවතර්න | 527,466.00 | 527,466.00 | - | 100 |
| 160-01-02-1003 | | පුනරාවතර්න | 254,700.00 | 251,100.00 | 3,600.00 | 99 |
| 160-01-02-1101 | | පුනරාවතර්න | 25,200.00 | 24,948.00 | 252.00 | **99** |
| 160-02-03-118-2507 | | ප්‍රාග්ධන | 420,000.00 | 416,287.25 | 3,712.75 | 99 |
| 160-02-03-153-2509-13 | | ප්‍රාග්ධන | 16,195,000.00 | 11,929,787.94 | 4,265,212.06 | 74 |
| එකතුව | | | **17,422,366.00** | **13,149,589.19** | **4,272,776.81** | |
| 171-02-08-001-1501 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | පුනරාවතර්න | 324,219,000.00 | 306,711,000.00 | 17,508,000.00 | 95 |
| 171-02-08-02-1501 | | පුනරාවතර්න | 103,494,200.00 | 94,482,600.00 | 9,011,600.00 | 91 |
| 171-02-08-003-1501 | | පුනරාවතර්න | 9,724,000.00 | 9,610,000.00 | 114,000.00 | 99 |
| 171-02-06-07-2202 | | ප්‍රාග්ධන | 108,500.00 | 47,500.00 | 61,000.00 | 44 |
| 171-02-06-0-1101 | | පුනරාවතර්න | 378,000.00 | 319,297.19 | 58,702.81 | 84 |
| 171-02-08-0-1201 | | පුනරාවතර්න | 110,250.00 | 83,250.00 | 27,000.00 | **76** |
| 171-02-08-0-1101 | | පුනරාවතර්න | 240,000.00 | 213,031.59 | 26,968.41 | 89 |
| 171-02-06-0-1201 | | පුනරාවතර්න | 155,250.00 | 148,500.00 | 6,750.00 | 96 |
| 171-02-06-004-2509 | | ප්‍රාග්ධන | 120,900.00 | 106,540.00 | 14,360.00 | 88 |
| 171-02-06-007-2509 | | ප්‍රාග්ධන | 2,743,300.00 | 2,735,190.00 | 8,110.00 | 100 |
| 171-02-08-0-2102 | | ප්‍රාග්ධන | 3,716,700.00 | 3,706,384.20 | 10,315.80 | 100 |
| 171-02-08-14-1409 | | පුනරාවතර්න | 89,000.00 | 88,910.00 | 90.00 | 100 |
| 171-02-08-14-2509 | | ප්‍රාග්ධන | 433,734.00 | 413,391.30 | 20,342.70 | 95 |
| 171-02-06-02-2509 | | ප්‍රාග්ධන | 100,000.00 | 100,000.00 | - | 100 |
| 171-02-08-000-2001 | | ප්‍රාග්ධන | 35,000,000.00 | 24,781,966.79 | 10,218,033.21 | 71 |
| 171-02-08-00-2103 | | ප්‍රාග්ධන | 1,169,500.00 | 1,162,578.48 | 6,921.52 | 99 |
| 171-01-02-1101 | | පුනරාවතර්න | 17,140.00 | 16,625.80 | 514.20 | 97 |
| එකතුව | | | **48,819,474.00** | **444,726,765.35** | **37,092,708.65** | |
| 186-02-03-024-2509 | ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | ප්‍රාග්ධන | 13,000,000.00 | 12,893,605.80 | 106,394.20 | 99 |
| එකතුව | | | 13,000,000.00 | 12,893,605.80 | 106,394.20 | |
| 189-01-02-002-1509 | මහජන ආරක්ෂක හා පාලරීමේන්තු කටයුතු අමාත්‍යාංශය | පුනරාවතර්න | 190,440.00 | 111,330.87 | 79,109.13 | 58 |
| 189-01-02-0-1101 | | පුනරාවතර්න | 48,000.00 | 46,488.39 | 1,511.61 | 97 |
| එකතුව | | | **238,440.00** | **157.819.26** | **80,620.74** | |
| 194-01-02-149-083 | යෞවන කටයුතු හා ක්‍රිඩා අමාත්‍යාංශය | පුනරාවතර්න | 410,000.00 | 141,875.00 | 268,125.00 | 35 |
| 194-02-07-01-2201 | | ප්‍රාග්ධන | 1,995,456.00 | 1,995,456.00 | - | 100 |
| එකතුව | | | **2,405,456.00** | **2,137,331.00** | **268,125.00** | |
| 193-01-02-02-2509 | කම්කරු සබදතා හා ඵලදායිතා ප්‍රවධර්න අමාත්‍යාංශය | ප්‍රාග්ධන | 66,550.00 | 66,550.00 | - | 100 |
| එකතුව | | | **66,550.00** | **66,550.00** | | |
| 196-2-07-0-1201 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | පුනරාවතර්න | 80,000.00 | 61,000.00 | 19,000.00 | 76 |
| 196-2-7-0-1402 | | පුනරාවතර්න | 45,000.00 | 11,500.00 | 33,500.00 | 26 |
| 196-2-7-0-1403 | | පුනරාවතර්න | 135,000.00 | 70,332.88 | 64,667.12 | 52 |
| 196-2-7-0-1101 | | පුනරාවතර්න | 312,000.00 | 166,235.59 | 145,764.41 | 53 |
| 196-2-7-0-2509 | | ප්‍රාග්ධන | 40,000.00 | 30,000.00 | 10,000.00 | 75 |

| වැය විෂය | අමාත්‍යාංශ/ දෙපාතර්මේන්තු | වියදම් වගර්ය | ලැබූ ප්‍රතිපාදන (රු.) | සත්‍ය වියදම (රු) | ඉතිරිය (රු) | උපයෝජනය % |
|---|---|---|---|---|---|---|
| 196-2-7-0-2102 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | ප්‍රාග්ධන | 53,962.00 | 53,883.00 | 79.00 | 100 |
| 196-02-07-0-1002 | | පුනරාවතර්න | 6,422.00 | - | 6,422.00 | - |
| 196-2-7-1409-140 | | පුනරාවතර්න | 5,850.00 | - | 5,850.00 | - |
| එකතුව | | | **678,234.00** | **392,951.47** | **285,282.53** | |
| 201-2-2-0-1101 | බෞද්ධ කටයුතු අමාත්‍යාංශය | පුනරාවතර්න | 33,000.00 | 33,000.00 | - | |
| 201-2-2-0-1201 | | පුනරාවතර්න | 183,900.00 | 183,147.84 | 752.16 | 100 |
| 201-1-1-0-1409-140 | | පුනරාවතර්න | 2,100.00 | - | 2,100.00 | - |
| 201-2-2-6-1508 | | පුනරාවතර්න | 898,020.00 | 526,320.00 | 371,700.00 | 58 |
| 201-2-2-0-1409-13 | | පුනරාවතර්න | 19,267.00 | 12,901.66 | 6,364.34 | 67 |
| 201-2-2-8-2205 | | ප්‍රාග්ධන | 3,000,000.00 | 2,888,298.11 | 111,701.89 | 96 |
| 201-2-2-15-1501 | | පුනරාවතර්න | 5,647,500.00 | 5,222,500.00 | 425,000.00 | 92 |
| 201-2-2-11-2202-31 | | ප්‍රාග්ධන | 120,000.00 | 120,000.00 | - | - |
| 201-2-2-1-1501 | | පුනරාවතර්න | 109,763.00 | 108,363.00 | 1,400.00 | 98 |
| එකතුව | | | **10,013,550.00** | **9,094,530.61** | **919,019.39** | |
| 202-2-1-7-2205 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාතර්මේන්තුව | ප්‍රාග්ධන | 800,000.00 | 800,000.00 | - | 100 |
| 202-2-1-0-1201 | | පුනරාවතර් | 15,000.00 | 15,000.00 | - | 100 |
| එකතුව | | | **815,000.00** | **815,000.00** | - | |
| 203-2-1-0-1201 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාතර්මේන්තුව | පුනරාවතර්න | 1,500.00 | 1,500.00 | | 100 |
| 203-02-01-2-2102 | | ප්‍රාග්ධන | 66,034.25 | 66,034.25 | | 100 |
| 203-02-01-1508-18 | | පුනරාවතර්න | 20,000.00 | 20,000.00 | | 100 |
| එකතුව | | | **87,534.25** | **87,534.25** | | |
| 206-02-03-04-1508 | සංස්කෘතික කටයුතු දෙපාතර්මේන්තුව | පුනරාවතර්න | 310,000.00 | 294,970.00 | 15,030.00 | 95 |
| 206-02-03-1201 | | පුනරාවතර්න | 130,000.00 | 119,999.60 | 10,000.40 | **92** |
| 206-02-03-1402 | | පුනරාවතර්න | 62,500.00 | 43,082.17 | 19,417.83 | 69 |
| 206-02-03-6-1409 | | පුනරාවතර්න | 379,600.00 | 355,095.00 | 21,505.00 | 94 |
| 206-02-02-2-1409 | | පුනරාවතර්න | 470,000.00 | 427,271.00 | 42,729.00 | 91 |
| 206-02-03-0-1101 | | පුනරාවතර්න | 344,000.00 | 115,343.65 | 228,656.35 | 34 |
| 206-02-03-03-1508 | | පුනරාවතර්න | 47,088.00 | 39,240.00 | 7,848.00 | 83 |
| එකතුව | | | **1,740,188.00** | **1,395,001.42** | **345,186.58** | |
| 210-01-02-0-1002 | රජයේ තොරතුරු දෙපාතර්මේන්තුව | පුනරාවතර්න | 12,596.00 | 12,595.48 | 0.52 | **100** |
| 210-01-02-0-1101 | | පුනරාවතර්න | 86,090.00 | 81,928.63 | 4,161.37 | **95** |
| 210-01-02-0-1201 | | පුනරාවතර්න | 7,200 | 7,200.00 | - | 100 |
| 210-01-02-0-1205 | | පුනරාවතර්න | 25,420.00 | 25, 420.00 | - | 100 |
| 210-01-02-0-1402 | | පුනරාවතර්න | 24,600.00 | 20,831.95 | 3,768.05 | 85 |
| 210-01-02-0-1403 | | පුනරාවතර්න | 97,500.00 | 97,500.00 | - | 100 |
| 210-01-02-2002 | | ප්‍රාග්ධන | 132,625.75 | 132,625.75 | - | 100 |
| එකතුව | | | **386,031.75** | **378,101.80** | **7,929.94** | |
| 216-02-03-08-1501 | සමාජ සේවා දෙපාතර්මේන්තුව | පුනරාවතර්න | 653,000.00 | 583,465.00 | 69,535.00 | 89 |
| 216-02-02-0-1001 | | පුනරාවතර්න | 9,488,214.00 | 8,329,726.37 | 1,158,487.63 | 88 |
| 216-02-02-0-1003 | | පුනරාවතර්න | 4,431,900.00 | 3,800,174.00 | 631,726.00 | 86 |
| 216-02-02-0-1101 | | පුනරාවතර්න | 437,600.00 | 299,669.70 | 137,930.30 | 68 |
| 216-02-02-0-1201 | | පුනරාවතර්න | 137,500.00 | 120,500.00 | 17,000.00 | 88 |
| 216-02-03-005-2202 | | ප්‍රාග්ධන | 515,055.00 | 484,529.25 | 30,525.75 | 94 |
| 216-02-03-01-1501 | | පුනරාවතර්න | 1.124,900.00 | 479,155.00 | 645,745.00 | 43 |

| වැය විෂය | අමාත්‍යාංශ/ දෙපාතර්මේන්තු | වියදම් වගර්ය | ලැබූ ප්‍රතිපාදන (රු.) | සත්‍ය වියදම (රු) | ඉතිරිය (රු.) | උපයෝජනය % |
|---|---|---|---|---|---|---|
| 216-02-03-02-1501 | සමාජ සේවා දෙපාතර්මේන්තුව | පුනරාවතර්න | 25,000.00 | 25,000.00 | - | 100 |
| 216-02-03-1402 | | පුනරාවතර්න | 50,000.00 | - | 50,000.00 | - |
| එකතුව | | | **16,863,169.00** | **14,122,219.32** | **2,740,949.68** | - |
| 217-2-2-0-1101 | පරිවාස හා ළමා ආරක්ෂක දෙපාතර්මේන්තුව | පුනරාවතර්න | 312,000.00 | 223,452.97 | 88,547.03 | 72 |
| 217-2-2-0-1201 | | පුනරාවතර්න | 58,500.00 | 54,770.00 | 3,730.00 | 94 |
| 217-2-2-5-2202 | | ප්‍රාග්ධන | 1,029,600.00 | 914,893.00 | 114,707.00 | 89 |
| 217-2-2-6-2202 | | ප්‍රාග්ධන | 243,500.00 | 233,500.00 | 10,000.00 | 96 |
| එකතුව | | | **1,643,600.00** | **1,426,615.97** | **216,984.03** | |
| 219-2-2-0-1101 | ක්‍රීඩා සංවධර්න දෙපාතර්මේන්තුව | පුනරාවතර්න | 36,280.00 | 10,005.00 | 26,275.00 | 28 |
| 219-2-2-0-1201 | | පුනරාවතර්න | 18,820.00 | 15,997.80 | 2,822.20 | 85 |
| 219-02-02-0-1002 | | පුනරාවතර්න | 18,584.48 | 18,584.48 | - | 100 |
| 219-02-02-0-1409-140 | | පුනරාවතර්න | 130,650.00 | 74,325.00 | 56,325.00 | **57** |
| එකතුව | | | **204,334.48** | **118,912.28** | **85,422.20** | |
| 227-1-1-0-1001 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් දෙපාතර්මේන්තුව | පුනරාවතර්න | 10,901,040.90 | 10,901,040.90 | - | 100 |
| 227-1-1-0-1003-099 | | පුනරාවතර්න | 4,820,714.94 | 4,820,714.94 | - | 100 |
| 227-01-01-0-1201 | | පුනරාවතර්න | 198,000.00 | 147,850.00 | 50,150.00 | 75 |
| 227-01-01-0-1101 | | පුනරාවතර්න | 194,501.50 | 194,501.50 | - | 100 |
| 227-01-01-0-1302 | | පුනරාවතර්න | 41,500.00 | - | 41,500.00 | - |
| 227-01-01-0-1303 | | පුනරාවතර්න | 11,220.00 | 11,200.00 | 20.00 | 100 |
| 227-01-01-0-1409-138 | | පුනරාවතර්න | 9,800.00 | 9,800.00 | - | 100 |
| එකතුව | | | **16,176,777.34** | **16,085,107.34** | **91670.00** | |
| 237-01-02-01-2509 | ජාතික සැලසුම්කරන දෙපාතර්මේන්තුව | ප්‍රාග්ධන | 46,000,000.00 | 45,744,863.93 | 255,136.07 | 99 |
| එකතුව | | | **46,000,000.00** | **45,744,863.93** | **255,136.07** | |
| 247-1-1-0-2001 | ශ්‍රිලංකා රේගුව | ප්‍රාග්ධන | 10,100,000.00 | 7,935,905.98 | 2,164,094.02 | 79 |
| එකතුව | | | **10,100,000.00** | **7,935,905.98** | **2,164,094.02** | |
| 248-1-1-0-2001 | සුරාබදු දෙපාතර්මේන්තුව | ප්‍රාග්ධන | 4,928,400.00 | 3,747,460.00 | 1,180,939.60 | 76 |
| එකතුව | | | **4,928,400.00** | **3,747,460.00** | **1,180,939.60** | |
| 252-1-1-8-2507-13 | ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාතර්මේන්තුව | ප්‍රාග්ධන | 22,840,095.00 | 22,606,046.67 | 234,048.33 | 99 |
| 252-1-1-1409-34 | | පුනරාවතර්න | 729,548.00 | 647,006.46 | 82,541.54 | 99 |
| 252-01-01-1202-009 | | පුනරාවතර්න | 207,379.00 | 207,376.00 | - | 100 |
| 252-1-1-0-1301 | | පුනරාවතර්න | 358,710.00 | 358,710.00 | - | 100 |
| 252-1-1-0-1403 | | පුනරාවතර්න | 266,967.59 | 266,967.59 | - | 100 |
| 252-1-1-0-1201 | | පුනරාවතර්න | 37,812.48 | 37,812.48 | | 100 |
| 252-1-1-0-1402 | | පුනරාවතර්න | 68,933.95 | 68,933.95 | | 100 |
| 252-1-1-0-1101 | | පුනරාවතර්න | 461,320.00 | 454,409.98 | 6,910.02 | 98 |
| 252-1-1-0-1002 | | පුනරාවතර්න | 267,757.27 | 267,198.80 | 558.47 | 100 |
| 252-1-1-11-2507 | | ප්‍රාග්ධන | 2,049,509.76 | 993,969.54 | 1,055,540.22 | 48 |
| 252-01-01-1409(138) | | පුනරාවතර්න | 233,418.05 | 233,418.05 | - | **100** |
| එකතුව | | | **27,521,448.10** | **26,141,849.52** | **1,379,598.58** | |
| 253-1-2-1-1502-1 | විශ්‍රාම වැටුප් දෙපාතර්මේන්තුව | පුනරාවතර්න | 201,000.00 | 121,840.00 | 79,160.00 | 61 |
| 253-1-2-2-1502-2 | | පුනරාවතර්න | 590,000.00 | 530,568.80 | 59,431.20 | 90 |
| 253-1-02-04-1502-12 | | පුනරාවතර්න | 1,951,725.62 | 1,951,725.62 | - | 100 |
| 253-1-2-0-1002 | | පුනරාවතර්න | 310,000.00 | 232,671.06 | 77,328.94 | 75 |
| 253-1-2-0-1101 | | පුනරාවතර්න | 85,000.00 | 67,435.80 | 17,564.20 | 79 |
| 253-1-2-3-1502-7 | | පුනරාවතර්න | 25,000.00 | 13,000.00 | 12,000.00 | 52 |
| 253-1-2-3-1502-8 | | පුනරාවතර්න | 30,000.00 | 11,,500.00 | 18,500.00 | 38 |
| එකතුව | | | **3,192,725.62** | **2,928,741.28** | **263,984.34** | |

| වැය විෂය | අමාත්‍යාංශ/ දෙපාතර්මේන්තු | වියදම් වගරය | ලැබූ ප්‍රතිපාදන (රු.) | සත්‍ය වියදම (රු) | ඉතිරිය රු. | උපයෝජනය % |
|---|---|---|---|---|---|---|
| 254-1-2-0-2001 | රෙජිස්ටාර් ජනරාල් දෙපාතර්මේන්තුව Department | ප්‍රාග්ධන | 661,641.40 | 661,641.40 | - | 100 |
| එකතුව | | | **661,641.40** | **661,641.40** | | |
| 282-2-3-5-2105 | වාරිමාගර් දෙපාතර්මේන්තුව | ප්‍රාග්ධන | 124,400.00 | 124,390.25 | **9.75** | **100** |
| එකතුව | | | **124,400.00** | **124,390.25** | 9.75 | |
| 284-01-01-0-1508 | වන සංරක්ෂන දෙපාතර්මේන්තුව | පුනරාවතර්න | 14,023,000.00 | 13,451,597.00 | 571,403.00 | 96 |
| එකතුව | | | **14,023,000.00** | **13,451,597.00** | **571,403.00** | |
| 286-02-01-0-1001 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාතර්මේන්තුව | පුනරාවතර්න | 21,287,782.00 | 21,216,481.96 | 71,300.04 | 100 |
| 286-02-01-0-1002 | | පුනරාවතර්න | 755,250.02 | 718,808.58 | 36,441.44 | 95 |
| 286-02-01-0-1003 | | පුනරාවතර්න | 1,041,900.001 | 11,008,912.88 | 32,987.12 | 100 |
| 286-02-01-0-1101 | | පුනරාවතර්න | 892,125.50 | 602,129.26 | 289,996.24 | 67 |
| 286-02-01-0-1201 | | පුනරාවතර්න | 432,349.40 | 431,688.79 | 660.61 | 100 |
| 286-02-01-0-1202-002 | | පුනරාවතර්න | 150,000.00 | - | 150,000.00 | - |
| 286-02-01-0-1202-009 | | පුනරාවතර්න | 881,850.00 | 878,711.00 | 3,139.00 | 100 |
| 286-02-01-0-1301 | | පුනරාවතර්න | 334,139.00 | 206,077.19 | 128,061.81 | 62 |
| 286-02-01-0-1302 | | පුනරාවතර්න | 190,294.00 | 190,290.00 | 4.00 | 100 |
| 286-02-01-0-1303 | | පුනරාවතර්න | 166,650.00 | 157,600.00 | 9,590.00 | 94 |
| 286-02-01-0-1402 | | පුනරාවතර්න | 353,335.85 | 342,911.09 | 10,424.76 | 97 |
| 286-02-01-0-1403 | | පුනරාවතර්න | 346,485.83 | 156,377.84 | 190,107.99 | 45 |
| 286-02-01-0-1404 | | පුනරාවතර්න | 1,825.00 | 1,824.20 | 0.80 | 100 |
| 286-02-01-0-1409-140 | | පුනරාවතර්න | 148,230.00 | 122,040.00 | 26,190.00 | 82 |
| 286-02-01-0-1506 | | පුනරාවතර්න | 140,000.00 | 133,108.97 | 6,891.03 | 95 |
| 286-02-01-0-2003 | | පුනරාවතර්න | 50,500.00 | 50,500.00 | - | 100 |
| 286-02-01-0-2001 | | ප්‍රාග්ධන | 1,934,315.00 | 1,933,537.77 | 777.23 | 100 |
| 286-02-01-0-2105 | | ප්‍රාග්ධන | 288,001.00 | 284,166.34 | 3,834.66 | 99 |
| 286-02-01-0-1203-002 | | පුනරාවතර්න | 4,000.00 | 4,000.00 | - | 100 |
| 286-02-01-0-1409-73 | | පුනරාවතර්න | 457,997.00 | 358,347.00 | 99,650.00 | 78 |
| 286-02-01-0-2102 | | ප්‍රාග්ධන | 914,745.00 | 914,741.00 | 4.00 | 100 |
| 286-02-01-0-2106 | | ප්‍රාග්ධන | 32,900.00 | 29,850.00 | 3,050.00 | 91 |
| 286-02-01-0-2103 | | ප්‍රාග්ධන | 1,759,930.00 | 1,314,053.52 | 445,876.48 | 75 |
| එකතුව | | | **42,564,604.60** | **41,055,617.39** | **1,508,987.21** | |
| 290-01-01-0-2001 | ධිවර හා ජලජ සම්පත් දෙපාතර්මේන්තුව | ප්‍රාග්ධන | 2,212,890.00 | 2,211,546.80 | 1,343.20 | 100 |
| එකතුව | | | **2,212,890.00** | **2,211,546.80** | **1343.20** | |
| 307-2-1-0-1002 | මොටර් රථ ප්‍රවාහන දෙපාතර්මේන්තුව | පුනරාවතර්න | 1,200,000.00 | 1,172,116.04 | 27,883.96 | 98 |
| 307-2-1-0-1003 | | පුනරාවතර්න | 320,000.00 | 282,000.00 | 38,000.00 | 88 |
| 307-2-1-0-1201 | | පුනරාවතර්න | 45,000.00 | 44,686.88 | 313.12 | 99 |
| 307-2-1-0-1402 | | පුනරාවතර්න | 160,000.00 | 131,453.89 | 28,546.11 | 82 |
| 307-2-1-0-1403 | | පුනරාවතර්න | 600,000.00 | 530,029.04 | 69,970.96 | 88 |
| 307-2-1-0-1404 | | පුනරාවතර්න | 18,500.00 | 17,782.62 | 717,38 | 96 |
| 307-2-1-0-1405 | | පුනරාවතර්න | 450,000.00 | 438,640.34 | 11,359.66 | 97 |
| 307-2-1-0-1407 | | පුනරාවතර්න | 1,030,000.00 | 1,017,000.00 | 13,000.00 | 99 |
| 307-2-1-0-1409-140 | | පුනරාවතර්න | 45,000.00 | 45,000.00 | - | 100 |
| 307-2-1-0-1302 | | පුනරාවතර්න | 25,000.00 | 19,000.00 | 6,000.00 | 76 |
| 307-2-1-6-1409 | | පුනරාවතර්න | 86,000.00 | 82,405.00 | 3,595.00 | 96 |

| වැය විෂය | අමාත්‍යාංශ/ දෙපාතර්මේන්තු | වියදම් වගර්ය | ලැබූ ප්‍රතිපාදන (රු.) | සත්‍ය වියදම (රු) | ඉතිරිය රු. | උපයෝජනය % |
|---|---|---|---|---|---|---|
| 307-2-1-10-2104 | මොටර් රථ ප්‍රවාහන දෙපාතර්මේන්තුව | ප්‍රාග්ධන | 5,795,150.00 | 5,640,150.00 | 155,000.00 | 97 |
| 307-2-1-0-1101 | | පුනරාවතර්න | 25,000.00 | 8,912.36 | 16,087.64 | 36 |
| 307-2-1-0-1202-009 | | පුනරාවතර්න | 35,000.00 | 19,941.00 | 15,059.00 | 57 |
| එකතුව | | | **9,834,650.00** | **9,449,117.17** | **385,532.83** | |
| 326-1-1-0-1101 | ප්‍රජා පාදක විශෝධන දෙපාතර්මේන්තුව | පුනරාවතර්න | 144,000.00 | 129,408.87 | 14,591.13 | 90 |
| 326-1-1-0-1201 | | පුනරාවතර්න | 9,000.00 | 9,000.00 | - | 100 |
| එකතුව | | | **153,000.00** | **138,408.87** | **14,591.13** | |
| 327-2-1-0-2507 | ඉඩම් පරිහරන ප්‍රතිපත්ති සැලසුම් දෙපාතර්මේන්තුව | ප්‍රාග්ධන | 1,175,00 | 1,173,757.00 | 1,243.00 | 100 |
| 327-2-1-0-2509 | | ප්‍රාග්ධන | 158,000.00 | 117,990.00 | 40,010.00 | 75 |
| 327-2-1-0-1101 | | පුනරාවතර්න | 248,000.00 | 198,278.00 | 49,722.00 | 80 |
| 327-2-1-0-1201 | | පුනරාවතර්න | 43,000.00 | 43,000.00 | - | 100 |
| එකතුව | | | **1,624,000.00** | **1,533,025.00** | **90,975.00** | |
| 328-2-2-11-2509 | මිනිස් බල හා රැකියා දෙපාතර්මෙන්තුව | ප්‍රාග්ධන | 358,200.00 | 356,887.00 | 1,313.00 | 100 |
| 328-1-1-0-1402 | | පුනරාවතර්න | 42,989.25 | 36,121.55 | 6,867.70 | 84 |
| 328-1-1-0-1101 | | පුනරාවතර්න | 369,000.00 | 360,741.33 | 8,258.67 | 98 |
| 328-1-1-0-1201 | | පුනරාවතර්න | 20,000.00 | 13,388.00 | 6,612.00 | 67 |
| 328-1-1-0-2102 | | ප්‍රාග්ධන | 80,820.00 | 80,820.00 | - | 100 |
| 328-1-1-0-1403 | | පුනරාවතර්න | 36,000.00 | 36,000.00 | - | 100 |
| 328-2-2-12-2509 | | ප්‍රාග්ධන | 133,300.00 | 133,300.00 | - | 100 |
| එකතුව | | | **1,040,309.25** | **1,017,257,88** | **23,051.37** | |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාතර්ා කිරීමේ කාර්‍ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 01.01.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාතර්ාව අනුව ශේෂය | 31.12.2025 දිනට මූල්‍ය තත්ව වාතර්ාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම් කිරීමට නියමිත | ප්‍රගතිය % ලෙස වාතර්ා කිරීම |
|---|---|---|---|---|---|
| 6111107 | නිල නිවාස | 242,213,643.47 | 242,213,643.47 | - | 100% |
| 6111108 | සංචාරක බංගලා | 4,500,000.00 | 4,500,000.00 | - | 100% |
| 6111201 | කායර්ල ගොඩනැගිලි | 801,169,930.19 | 813,559,361.10 | - | 100% |
| 6112101 | මගී ප්‍රවාහන වාහන | 154,204,717.50 | 155,999,863.50 | - | 100% |
| 6112102 | භාණ්ඩ ප්‍රවාහන වාහන | 24,500,000.00 | 24,500,000.00 | - | 100% |
| 6112103 | කෘෂි වාහන | 33,000,000.00 | 33,000,000.00 | - | 100% |
| 6112109 | මෝටර් සයිකල් | 1,586,600.00 | 1,552,600.00 | - | 100% |
| 6112201 | කායර්ාල උපකරණ | 16,244,572.09 | 16,141,598.09 | | 100% |
| 6112202 | පරිගණක උපකරණ | 52,729,438.81 | 61,635,394.38 | - | 100% |
| 6112203 | විදුලි උපකරණ | 38,959,331.13 | 44,433,495.98 | - | 100% |
| 6112204 | සංන්නිවේදන උපකරණ | 10,193,716.96 | 11,864,877.77 | - | 100% |
| 6112205 | ගෘහ භාණ්ඩ | 64,281,372.73 | 74,210,751.37 | - | 100% |
| 6141101 | වානිජ හා සේවාවන් | 288,953,000.00 | 288,953,000.00 | - | 100% |
| 614100 | ඉඩම් වටිනාකම | 67,464,244.30 | 77,407,443.08 | - | 100% |
| | **එකතුව** | **1,800,000,567.18** | **1,849,972,028.74** | | **-** |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාතර්ාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No.: EPCG/TR/A/DST/02/2025/01 | ඔබේ අංකය / உமது இல. / Your No.: | දිනය / திகதி / Date: 2026 මැයි 21 දින |

ගණන්දීමේ නිලධාරී,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
ත්‍රිකුණාමලය.

**ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධිත) පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 මැයි 21 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.)

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති  රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත.  මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති  රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා  සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත (SA -82) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ ලෙජර් අංක 9152 යටතේ ඇතුළත් කර තිබුණු අයිතම කාණ්ඩ 04 ක අවසාන ශේෂයන්, 2025 වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත (SA -82) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ ආරම්භක ශේෂයන් සමඟ සැසඳීමේදී රු.1,409,504 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු විගණනයේදී අනාවරණය නොවුණි.

(ආ) භාණ්ඩාගාර මුද්‍රිත (SA -82) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ ලෙජර් අංක 9152 (ප්‍රවාහන උපකරණ හා වෙනත් යන්ත්‍රෝපකරණ) වත්කම් කාණ්ඩය යටතේ සඳහන් අයිතමවල ආරම්භක ශේෂවලට එකතු කිරීම් හා වර්ෂයේ මිලදී ගැනීම්වල මුළු වටිනාකම රු.31,060,895 ක් වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා නව සිගාස් වැඩසටහන (SA - 100) මඟින් පිළියෙල කළ ශේෂ පිරික්සුම් අනුව එහි වටිනාකම රු.31,054,045 වූයෙන් රු.9,850 ක වෙනසක් පැවතුණි.

(ඇ) භාණ්ඩාගාර මුද්‍රිත (SA -82) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ ලෙජර් අංක 9152 (ප්‍රවාහන උපකරණ හා වෙනත් යන්ත්‍රෝපකරණ) වත්කම් කාණ්ඩයේ ප්‍රවර්ථන වර්ෂයේ ඉවත් කිරීම්වලට වටිනාකම රු.3,422,063 ක් වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා නව සිගාස් වැඩසටහන (SA -100) මඟින් පිළියෙල කළ ශේෂ පිරික්සුම් අනුව එහි වටිනාකම රු.3,885,863 ක් වූයෙන් රු.463,800 ක වෙනසක් පැවතුණි.

(ඇ) භාණ්ඩාගාර මුද්‍රිත (SA -82) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ නොනිමි වැඩ (ලෙජර් අංක 9160) යටතේ ප්‍රවර්ථන වර්ෂයේ කිසිඳු වටිනාකමක් සඳහන් කර නොතිබුණු නමුත් දෙපාර්තමේන්තුව විසින් හා නව සිගාස් වැඩසටහන (SA -100) මඟින් පිළියෙල කළ ශේෂ පිරික්සුම් තුළ මූලධන වත්කම් වෙන්කිරීම් (නොනිමි) යටතේ රු.2,859,000ක් හර කර නොනිමි වැඩ යටතේ එම වටිනාකමම බැර කර තිබුණි.

(ඉ) භාණ්ඩාගාර මුද්‍රිත (SA -82) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ ලෙජර් අංක 9151 හි 1.2 යටතේ නේවාසික නොවන ගොඩනැගිලි යටතේ ඇතුළත් කර තිබුණු කාර්යාල ගොඩනැගිලි අයිතමයේ (කේත අංකය - 6111201) මිලදී ගැනීම් වටිනාකම රු.2,859,000 ක් වුවද එහි 1.2 යටතේ නේවාසික නොවන ගොඩනැගිලිවල (61112) උපඑකතුව රු.74,000 ක් වූයෙන් රු.2,785,000 ක වෙනසක් පැවතුණි.

(ඊ) ඒ.සී.ඒ.- 06 ආකෘතියට අනුව 2025 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණවල අවසාන ශේෂය රු.1,847,187,029ක් ලෙස සඳහන් වුවද, ලෙජර් අංක 9151 යටතේ නේවාසික නොවන ගොඩනැගිලිවල (Non-Residential Building -61112) උප එකතුවෙහි අවසාන ශේෂය හා ඒ යටතේ සඳහන් කාර්යාල උපකරණවල (Office Building - 6111201) අවසාන ශේෂය අතර රු.2,785,000ක වෙනසක් නිරීක්ෂණය වූ බැවින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් දේපළ, පිරියත හා උපකරණවල අවසාන ශේෂයේ නිවැරදිතාවය සම්බන්ධයෙන් විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය.

(උ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයට අනුව 9152 වත්කම් කාණ්ඩයේ ඇතුළත් ප්‍රවාහන උපකරණ (2.1) යටතේ රු.34,000ක වටිනාකමකට යතුරු පැදියක් අපහරණය කර තිබුණු නමුත් එම යතුරු පැදියේ අපහරණ ක්‍රමවේදය සම්බන්ධයෙන් විගණනයට කරුණු වාර්තා නොවූ අතර මුදල් රෙගුලාසි 770(4) අනුව අපහරණ වටිනාකම ගිණුම්වලට හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.6.2 තැන්පතු ගිණුම් ශේෂ

(අ) 2025 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු තැන්පතු සැසඳුම් ප්‍රකාශනය හා තැන්පතු ලෙජරය අනුව නිරවුල් නොකරන ලද රු.732,205 ක තැන්පතු ශේෂයක් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වගෙන යන තැම්පත් ලේඛනය පරීක්ෂා කිරීමේදී මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව, වසර දෙකකට වඩා පවතින පැරණි රු.263,117 ක තැන්පතු මුදල් සම්බන්ධයෙන් කිසිඳු පියවරක් ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබිම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| භාණ්ඩ වට්ටෝරු ලේඛනය- කන්තලේ, සේරුවිල, මොරවැව, ගෝමරන්කඩවල, පදවිශ්‍රීපුර, වෙරුගල්, කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාල | මුදල් රෙගුලාසි 763 | යාවත්කාලීන කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| ඇප ලේඛණය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 | මුදල් රෙගුලාසි 891 (1) | පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| හානි පාඩු ලේඛනය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 | මුදල් රෙගුලාසි 110 (1) | යාවත්කාලීන කර නොතිබුණි. |

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (අ) | නිවැරදි වටිනාකම් අනුව ආරම්භක ශේෂ ගිණුම්ගත කිරීම කළ යුතුය. | 1.6.1 (අ) |
| 1.6.1 (ආ) | ලේඛන අතර ශේෂයන්හි නිරවද්‍යතාවය පැවතිය යුතුය. | 1.6.1 (ආ) |
| 1.6.1 (ඇ) | ලේඛන අතර ශේෂයන්හි නිරවද්‍යතාවය පැවතිය යුතුය. | 1.6.1 (ඇ) |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 ආදායම් කළමනාකරණය

ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5 වන වගන්තිය ප්‍රකාරව අදාළ නිලධාරීන්ට හිමි නිවාස කුලිය ගණනය කොට නිසි පරිදි ඔවුන්ගෙන් අයකර ගැනීම සිදුකළ යුතුවේ. නමුත් ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල නිවාස 06 ක නිවාස කුලිය වන රු.173,395 ක මුදල 2025 දෙසැම්බර් 31 වන විටත් හිඟව පවතින බව නිරීක්ෂණය විය. තවද මේ තුළ T75 දරන නිල නිවසේ කුලිය 2023 අප්‍රේල් මස සිට මේ දක්වා වසර 02 යි මාස 09 කට වඩා වැඩි කාලයක සිට හිඟව පවතින අතර එම මුදල රු.127,840 ක් වේ.

## 3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක 2025 වර්ෂයට අදාළව 2026 වර්ෂයේ ගෙවා තිබුණු රු.2,856,779ක් පිරිවැය වූ බිල්පත් 157ක වටිනාකම 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර ඉතිරි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 හි තත්ත්වයද මේ හා සමාන විය හැකි බව තවදුරටත් නිරීක්ෂණය විය.

## 3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2015 අප්‍රේල් 27 දිනැති අංක 13/2015 දරන චක්‍රලේඛයේ 12 වන ඡේදය ප්‍රකාරව, එක් පවුලක ආබාධිත පුද්ගලයන් කිහිපදෙනෙකු සිටී නම්, ඔවුන්ට අධාර ලබාදීම සඳහා කමිටු තීරණයක් ලබාගත යුතුය. එසේ නොවන අවස්ථාවලදී සහනාධාර හිමිවන්නේ පවුලේ එක් අයෙකුට පමණක් වුවද, එම උපදේසවලට පටහැනිව කිසිඳු කමිටු තීරණයකින් තොරව ප්‍රතිලාභීන් 08 දෙනකු සඳහා මාස 11 ක කාලයකට රු.660,000 ක මුදලක් කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.

(ආ) 2019/20 මහ කන්නයේ සිට 2022 වර්ෂ වෙනුවෙන් වී මිලදී ගැනීමේ කඩිනම් වැඩ පිළිවෙල යටතේ කන්තලේ ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාශයේ සහල් මෝල් හිමිකරුවන් 04 දෙනෙකුගෙන්ද, පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහල් මොල් හිමිකරුවන් 01 නෙකුගෙන් සහ සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහල් මෝල් හිමියන් 02 නෙකුගෙන්ද ලෙස මෝල් හිමියන් 07 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතු වටිනාකම රු.47,957,307 ක් වූ වටිනාකම් මුදල් වර්ෂ 05 ක කාලයක් ඉක්ම ගියද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අයකරගෙන නොතිබුණි.

(ඇ) යුධ ගැටුම්වලින් බලපෑමට ලක් වූ පවුල් සඳහා ස්ථිර නිවාස ලබාදීමේ ව්‍යාප්තිය යටතේ සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 05 ක පදිංචිකරුවන් 08 දෙනෙකු සඳහා ලබාදී තිබුණු රු. 5,600,000 ක් වටිනා නිවාස 08 ක් 2025 ඔක්තෝබර් 31 වන විටද සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් අදාළ ප්‍රතිලාභීන් වෙත ගෙවා තිබුණු රු.4,125,000 මුදල නිශ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.

(ඈ) යුධ ගැටුම්වලින් බලපෑමට ලක් වූ පවුල් සඳහා ස්ථිර නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදිංචිකරුවන් 05 දෙනෙකු සඳහා 2021 හා 2023 වර්ෂවල ලබාදී තිබුණු රු.4,200,000 ක් වටිනා නිවාස 05 ක් 2025 දෙසැම්බර් 12 වන දින වන විටද සම්පූර්ණ කර නොතිබීම නිසා අදාළ ප්‍රතිලාභීන් වෙත ගෙවා තිබුණු රු.3,325,000 ක මුදල නිශ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.

(ඉ) 2025 වර්ෂයේ ගර්භණී මාතාවන් සඳහා පෝෂණ ආහාර ලබාදීම වැඩසටහන යටතේ නගර හා කඩවත්, කින්නියා, වෙරුගල්, සේරුවිල, කන්තලේ, තඹලගමුව සහ මුතූර් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අදාළව ප්‍රතිලාභීන් 316 දෙනෙකු විසින් රු.1,422,000 ක වටිනා පෝෂණ මළු ලබාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

### 3.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ.

| | රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 104(4) වගන්තිය | KB-957 දරණ මොන්ටේරෝ ජීප් රථය 2023 ජනවාරි 28 දිනදී දරුණු අනතුරට ලක්ව රියදුරුද මියගිය අතර ඒ පිළිබඳ පරීක්ෂණයෙන් පසු අලාභ හානිය සිදු වූ (නැතහොත් ඒ අනුව දැනගන්නට ලැබුණු) දින සිට තුන් මසක් ඇතුලත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) චක්‍රලේඛ අංක 09/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (iv) ඡේදය | අතිකාල හා නිවාඩු දින ගෙවීම් කිරීමේදී ඇඟිලි සළකුණු යන්ත්‍ර මඟින් තහවුරු කිරීම අත්‍යවශ්‍ය වුවත් කින්නියා, ගෝමරන්කඩවල, වෙරුගල්, සේරුවිල, කන්තලේ, තඹලගමුව, මුතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිළධාරීන් විසින් එලෙස කටයුතු නොකර සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රුපියල් 1,987,988 ක් අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස ලබා ගෙන තිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකළ යුතු වුවද, ත්‍රිකුණාමලය කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 225-993 කැබරථ 2023 මැයි 23 දිනෙන් පසු 2025 ජූලි 18 දින දක්වා ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |

**3.6 අවිධිමත් ගනුදෙනු**

(අ) දිස්ත්‍රික් ලේකම්වරයාගේ නියෝග අනුව සේරුවිල සහ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහන සඳහා සංචිත වාහනය (Pool Vehicle) සඳහා වන උපරිම මාසික ඉන්ධන සීමාව ලීටර් 100ක් වුවද සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් 2025 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ සීමාව ඉක්මවා ලීටර් 432 ක් සහ 442 ක් වැඩිපුර ලබාගෙන ඇති අතර, ඒ වෙනුවෙන් රු.125,563 ක් හා රු.125,281 ක මුදලක් අදාළ නියෝගය සහ මුදල් රෙගුලාසි 136 සහ 138(2) උල්ලංඝනය කරමින් ගෙවා තිබුණි.

(ආ) රු.749,436 ක වටිනාකමින් යුතු ගෙවීම් වවුචර් 04 ක වියදම් සහතික කරන නිලධාරියාගේ අත්සන පමණක් යොදා තිබූ අතර, ඔහුගේ තනතුරු නිල මුද්‍රාව තබා නොතිබුණි. තවද අදාල ගෙවීම් වටිනාකම අකුරින් සඳහන් කර නොතිබීමද නිරීක්ෂණය විය. මේ අනුව මුදල් රෙගුලාසි 138 අනුගමනය කරමින් ගෙවීම් වවුචර් සකස් කර නොතිබුණි.

3.7 තැන්පතු

(අ) 2025 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු තැන්පතු සැසඳුම් ප්‍රකාශනය හා තැන්පතු ලෙජරය අනුව නිරවුල් නොකරන ලද රු.732,205 ක තැන්පතු ශේෂයක් පැවතුණි.

(ආ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වගෙන යන තැම්පත් ලේඛනය පරීක්ෂා කිරීමේදී මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව, වසර දෙකකට වඩා පවතින පැරණි රු.263,117 ක තැන්පතු මුදල් සම්බන්ධයෙන් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ගිණුම් චක්‍රලේඛ අංක 02/2018 හා 2018 ජනවාරි 29 දිනැති චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහජනයා වෙත සපයන සේවා ප්‍රමුඛතා ගත කොට ප්‍රධාන සේවාවන් 5 කට අදාළව ප්‍රශස්ත ඉලක්කයන් තීරණය කර එම ඉලක්ක පිළිබඳ වාර්තාවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම චක්‍රලේඛයේ 2.5 හා 2.6 ඡේදයන්ට අනුව සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රශස්ත ඉලක්කයන් සාරාංශගත කොට සකස් කරන ලද වාර්තාවක් විගණකාධිපතිටද පිටපත් සහිතව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත සෑම වර්ෂයකම ජනවාරි 15 වන දිනට පෙර ඉදිරිපත් කල යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2024 වර්ෂයට අදාළව එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරිම

(අ) නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 2024 හා 2025 වර්ෂවල ලැබී තිබුණු ඉඩම් කච්චේරි අයදුම්පත් 1233 ක් සම්බන්ධයෙන් විගණිත දින වූ 2026 ජනවාරි 23 දින වන විටද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2020 හා 2022 වර්ෂවල ලැබුණු ඉඩම් කච්චේරි අයදුම්පත් 2313 ක් සඳහා විධිමත් පරිදි වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉඩම් කච්චේරි පවත්වා අදාළ බලපත්‍ර ලබාදීමට අවශ්‍ය කටයුතු 2025 ඔක්තෝබර් 17 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඇ) වසර 15 කට අධික කාලයක සිට සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිරිමංගලපුර හා සෝමපුර ග්‍රාම නිලධාරි වසම්වල නීත්‍යානුකූල අයිතියකින් තොරව භුක්තිවිඳින අක්කර 120 රූඩ් 03 පර්චස් 19ක භූමි ප්‍රමාණයකට අයත් ඉඩම් කට්ටි 185 කට අයත් තාවකාලික පදිංචිකරුවන් විසින් ලිඛිතව තම ඉඩම් කට්ටි සඳහා අවශ්‍ය බලපත්‍ර ලබාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉල්ලුම් කර තිබුණු නමුත් 2025 ඔක්තෝබර් 31 දින වන විටද අදාළ කටයුතු ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) 2024 වර්ෂයේ සිට 2025 වර්ෂයේ ඔක්තෝබර් 31 දින දක්වා ඉඩම් සංවර්ධන ආඥා පනත හා රජයේ ඉඩම් ආඥා පනත අනුව ඉඩම් ඉල්ලුම් කළ පුද්ගලයින් 59 සඳහා සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉඩම් කච්චේරි පවත්වා අදාළ තාවකාලික බලපත්‍ර ලබාදීමට අවශ්‍ය කටයුතු 2025 ඔක්තෝබර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඉ) 2021 මැයි 09 වන දින වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රක්ෂිතභාවයෙන් ඉවත් කිරීම සඳහා එකඟතාවය පලකර තිබුණු කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ඉඩම් අක්කර 3912.33 ක් සඳහා විගණිත දින වූ 2025 දෙසැම්බර් 12 වන දින වන විටද එම ඉවත් කිරීම සම්බන්ධයෙන් ගැසට් නිවේදනයක් නිකුත් කර නොතිබුණු බැවින් වසර 04 කට වැඩි කාලයක සිට එම ඉඩම් සම්බන්ධ ඉදිරි කටයුතු ප්‍රමාද වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) 2023 සැප්තැම්බර් 13 හා ඔක්තෝබර් 09 දින පැවති රැස්වීම්වලදී ලබාගත් තීරණ අනුව එතෙක් නිදහස් කර නොතිබුණු කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඉතිරි අක්කර 2445.57 ක ඉඩම් ප්‍රමාණයද සඳහා රක්ෂිතභාවයෙන් ඉවත් කිරීමට එකඟතාවය පළ කර තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන්ද ගැසට් නිවේදනයක් නිකුත් කිරීම විගණන දින වූ 2025 දෙසැම්බර් 12 දින වන විටද සිදුකර නොතිබුණු බැවින් එම ඉඩම්වල ඉදිරි කටයුතුද වසර 02 කට වැඩිකාලයක් ප්‍රමාද වී තිබුණි.

(උ) 2021 මැයි 09 වන දින වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රක්ෂිතභාවයෙන් ඉවත් කිරීම සඳහා එකඟතාවය පලකර තිබුණු කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ඉඩම් අක්කර 3912.33 ක් සඳහා විගණිත දින වූ 2025 දෙසැම්බර් 12 වන දින වන විටද එම ඉවත් කිරීම සම්බන්ධයෙන් ගැසට් නිවේදනයක් නිකුත් කර නොතිබුණු බැවින් වසර 04 කට වැඩි කාලයක සිට එම ඉඩම් සම්බන්ධ ඉදිරි කටයුතු ප්‍රමාද වී තිබුණු බව නිරීක්ෂණය විය.

### 4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම

(අ) කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2024 පෙබරවාරි 28 දිනැති චක්‍රලේඛයට අනුව ක්‍රියාත්මක කරන ලද එළු පාලන ව්‍යාපෘතිය අනුව එළුවන් බෙදා දෙන අවස්ථාවේදීම අනිවාර්යයෙන් රක්ෂණ කටයුතු සිදු කළ යුතු බවට උපදෙස් දී තිබුණද, ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 අගෝස්තු 16 දින බෙදා දුන් එළුවන් 15 දෙනා සඳහා රක්ෂණ ආවරණය ලබාගෙන ඇත්තේ දින 60 ක ප්‍රමාදයකින් පසුව, එනම් 2024 ඔක්තෝබර් 15 දින බැවින් ඉන් පසුව මිය යන ලද රු.75,975 වූ එළුවන් 03 දෙනෙකු සඳහා රක්ෂණ ආවරණ ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) 2025 වර්ෂයේ රජයේ විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කරුකාමුනෙයි ග්‍රාම නිලධාරි වසමේ පිහිටි නරියවෙඩ්ඩුවාන් කෘෂි මාර්ගයේ බෝක්කු 02 ක් සංවර්ධනය කිරීම සඳහා රු.2,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර අවසන් බිල්පත්‍රයේ අයිතම අංක 06,07 හා 08 යටතේ පිළිවෙලින් අනුමත බොරළු පස් යොදා බෝක්කුව දෙපස පිරවීම, JCB යන්ත්‍රයක් භාවිතයෙන් පස් මට්ටම් කිරීම හා ඉවුර දෙපස තණ පිඩලි ඇල්ලීම යන වැඩ විෂයන් ප්‍රමාණවත් පරිදි නියමිත ගුණත්වයෙන් යුතුව ඉටු කළ බවක් නිරීක්ෂණය නොවූ අතර තණ පිඩලි කිසිවක් පරීක්ෂණ අවස්ථාවේදී දක්නට නොලැබුණි. එබැවින් ඉහත අයිතම් යටතේ දරන ලද රු.156,498 ක වියදම නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.

(ඇ) 2021 වර්ෂයේ නිවාස ඉදිකිරීමට අදාළ ප්‍රගතිය දැක්වෙන වාර්තා අනුව සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.600,000 ක් නිවාස වැඩසටහනෙහි ප්‍රතිලාභීන් 30 ක් හා රුපියල් මිලියනයේ වැඩසටහනෙහි ප්‍රතිලාභීන් 32 ක් සම්පූර්ණයෙන්ම නිවාස ඉදිකර අවසන් බවට දක්වා තිබුනද, මෙම නිවාස වැඩසටහනේ ප්‍රතිලාභීන් 44 කගේ මූල්‍යාධාර එකතු වටිනාකම රුපියල් 2,308,000 ක් මෙම විගණන වාර්තාවේ දිනය වන විටත් සමෘද්ධි බැංකු ගිණුමේ රඳවා තබාගෙන සිටීම හේතුවෙන් ඔවුන්ගේ නිවාසවල වැඩ සම්පූර්ණ කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විගණනය වෙත ඉදිරිපත් කළ වාර්තාවන් සමඟ නිවාසවල භෞතික ප්‍රගතිය එකඟ නොවීය.

### 4.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

2024 වර්ෂයේ රු.1,050,000 ක රජයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ චේනෙයූර් (Chenaiyoor) ප්‍රදේශයේ ඉදිකළ පෙර පාසල් ගොඩනැගිල්ල 2025 ඔක්තෝබර් 17 විගණන දින වන විට වසරකට වැඩි කාලයක් භාවිතා නොකිරීම හේතුවෙන් නිෂ්කාර්ය තත්ත්වයට පත්වී තිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 ප්‍රසම්පාදනයන්

සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ්රථ දෙකක් සඳහා රු.489,000 ක් වැයකර ටයර් 10 ක් මිලට ගෙන තිබූ අතර මින් එක් කැබ් රථයක් සඳහා ටයර්වල සම්මත ප්‍රමාණය වනුයේ 255×15 වේ. නමුත් මිලට ගෙන තිබුණේ 235×75×15 ප්‍රමාණයේ ටයර් වේ. ඒ අනුව සම්මත ප්‍රමාණය වෙනස් කොට මිලදී ගැනීම සඳහා තාක්ෂණික නිලධාරිවරයෙකුගේ හෝ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශ ලැබී නොතිබුණි.

### 4.3 වත්කම් කළමනාකරණය

(අ) 2019 ජුනි 12 දිනැති දිස්ත්‍රික් ලේකම්ගේ ලිපිය අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් T-75 දරණ නිලනිවාසයේ කුලී පදනම මත ලබාදීමේ කාලය වන වසර 05 ඉක්මවා ඇති බවත් එය නැවත ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාර දෙන ලෙසත් සීමා සහිත ලංකා පොහොර සමාගමේ සභාපතිවරයා අමතා දැනුම් දී ඇත. නමුත් 2020 දෙසැම්බර් 21 දිනැති ලිපිය මගින් ලංකා පොහොර සමාගම් වැඩ බලන කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්) විසින් අදාල නිල නිවස තවදුරටත් තම ආයතය වෙත ලබාදෙන මෙන් ඉල්ලීමක් කළද උක්ත ඉල්ලීමට ප්‍රතිචාර ලෙස අදාළ නිල නිවස ලංකා පොහොර සමාගම වෙත වෙන්කර දිය නොහැකි බව දක්වා 2021 ජනවාරි 27 දිනැති ලිපිය මගින් ත්‍රිකුණාමලය අතිරේක දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ලංකා පොහොර සමාගමේ සභාපතිවරයා වෙත දන්වා යවනු ලැබුවද 2025 දෙසැම්බර් 31 දින වන විටද අදාළ නිල නිවස විධිමත් පරිදි පවරාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද 2023 අප්‍රේල් වන විට මේ දක්වා මෙම නිල නිවාසය වෙනුවෙන් රු.127,840 ක කුලී මුදලක්ද හිඟව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු G- 64 සහ 19- A යන නිල නිවාස පදිංචියට නුසුදුසු තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය වූ අතර 2025 දෙසැම්බර් 31 වන විටද මෙම නිල නිවාස අළුත්වැඩියා කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කන්තලේ පොලිසිය ඉදිරිපිට තනි පුද්ගල රජයේ පේලි නිවාසය ඉතා පැරණි බැවින් හා පදිංචියට සුදුසු තත්වයේ නොපවතින බැවින් කඩා ඉවත් කිරීම සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ඉංජිනේරුගේ නිර්දේශය ලැබී තිබෙන බව අතිරේක දිසාපති හා අතිරේක දිස්ත්‍රික් ලේකම්ගේ 2022 මාර්තු 14 දිනැති ලිපිය මගින් දන්වා තිබුණි. විගණිත දින වූ 2024 ඔක්තෝබර් 22 දින වනවිට එම ගොඩනැගිල්ලේ නිවාස 07 කින් නිවාස 05 ක පදිංචියව සිටින අතර අදාල නිවාසයන්හි පදිංචිය අනාරක්ෂිතව පවතින බව නිරීක්ෂණය විය ඉහත ලිපිය අනුව කඩා ඉවත් කිරීමට නිර්දේශය ලැබී වසර 02 මාස 07 ක් ඉක්මවා තිබුණද අදාල ඉවත් කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් නිලනිවාස 02 ද ඇතුළත්ව නිල නිවාස 07ක් සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත්ව පැවතියද නිල නිවාස 02 ක පමණක් පදිංචිව සිටින බව නිරීක්ෂණය වූ අතර එම පදිංචිව සිටින නිල නිවාස 02 ද අළුත්වැඩියා කලයුතු තත්ත්වයේ පවතින බැවින් පවත්නා වත්කම්වල ප්‍රශස්ථ උපයෝජනය ලබා ගත නොහැකි මට්ටමක පවතී. ඒ අනුව පැරණි ප්‍රාදේශීය ලේකම් නිලනිවස, සෝමපුර සංචාරක බංගලාව සහ වසර 42 ක් ඉක්මවා ඇති පොදු නිලනිවාස 05ම අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි.

(ඉ) කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සංචිත වාහනය 2020 වර්ෂයේ සිට විගණිත දින වූ 2025 ජූලි 18 දින දක්වා රු.1,500,000 කට ආසන්න පිරිවැයක් දරා අළුත්වැඩියා කොට තිබුණද 2025 ජූලි 18 දිනෙන් පසුව මෙම රථය භාවිතයෙන් ඉවත්කොට ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ අනාරක්ෂිතව ගාල්කර තිබුණි.

## 4.4 මුලා අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

(අ) 2021 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008(v) සහ 2022 පෙබරවාරි 10 දින (සංශෝධිත) අනුව නිකුත් කළ චක්‍රලේඛය ප්‍රකාරව වෙන්කළ වාහන සඳහා වූ ඉන්ධන සීමාව (ලීටර් 165) දැඩිව පිළිපැදිය යුතු බව දක්වා තිබුණු නමුත්, කින්නියා ප්‍රාදේශීය ලේකම්වරයා සඳහා වෙන්කළ කැබරථය වෙනුවෙන් 2024 වර්ෂයේ සැප්තැම්බර් 27 දින සිට 2025 වර්ෂයේ පෙබරවාරි 13 දින දක්වා කාලය තුළ අවස්ථා 13 කදී ඉන්ධන ලීටර් 440 ක ප්‍රමාණයක් 1202 වැය විෂය අංකය යටතේ ලබාගෙන තිබුණු බව තහවුරු වූ අතර, එම ඉන්ධන භාවිතයෙන් කාර්යාලීය රාජකාරී ඉටුකළ බවට පොදු 268 ආකෘතිය ප්‍රකාරව ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ නිවාස ව්‍යාපෘතියක ප්‍රතිලාභිනියකු වෙනුවෙන් 2019 නොවැම්බර් 06 දින බැංකුවෙන් මුදාහළ රු.225,000 ක මුදලින් රු.75,000 ක් වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන සංවර්ධන නිලධාරිවරයෙකු තමා සන්තකයේ තබාගෙන තිබුණි. පොලිස් පැමිණිල්ලකින් පසුව එම මුදල් අවස්ථා දෙකකදී ආපසු ගෙවා ඇති අතර නමුත් වසර 06 ක් ගතවී ඇතත් මෙම නිලධාරියාට එරෙහිව මෙම වාර්තාවේ දිනය දක්වා විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ඇ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සංචිත වාහනය සම්බන්ධ භෞතික පරීක්ෂාවට අනුව 2025 දෙසැම්බර් 09 දිනට මයිලෝ මීටරයේ පාඨාංකය 309416 ක් වුවද ධාවන සටහන් අනුව එහි පාඨාංකය 308734 ක් විය. ඒ අනුව කිලෝමීටර් 682 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර සංචිත වාහනය ලීටරයකට කිලෝමීටර් 08 ක කාර්යක්ෂමතාවයකින් යුතුව ධාවනය වන බැවින් වෙනස් වූ කිලෝමීටර් 682 ක දුර ප්‍රමාණය සඳහා වර්තමාන වෙළඳපොළ වටිනාකම අනුව රු.23,614 ක මූල්‍ය අලාභයක් නිරීක්ෂණය විය.

## 4.5 පාඩු හා හානි

(අ) 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ (ඇමුණුම් - I) (i) කොටසේ වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/ කපාහැරීම/ අත්හැරීම පිළිබඳ තොරතුරු ඇතුළත් කළ යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් 2023 වර්ෂයේ ජනවාරි 08 දින සිදු වූ අනතුරට අදාළ තවමත් අයනොවූ රු.2,124,270 ක අලාභය සටහන් කර තිබුණි.

(ආ) 2003 ජනවාරි 08 දින අනතුරට ලක්වූ ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ජීප් රථය නැවත යතා තත්වයට පත්කිරීම වෙනුවෙන් වැයවූ රු.2,124,270 ක අලාභය රක්ෂණ ආයතනය මගින් හානි පූරණය කරගැනීමට නොහැකිවීම තුල රජයට එම වටිනාකමින් අලාභයකි සිදුවී පැවතුණි. තවද මරණයට පත් රියදුරාගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවට අනුව සහ සිදුවී ඇති තුවාලවල ස්වභාවයෙන් අනාවරණය වනුයේ අනතුරට ලක්වන විට රථය පදවා ඇත්තේ අදාළ රථය භාරව සිටි රියදුරු නොවන බවයි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ආයතන අංශයෙන් ලබාදුන් තොරතුරු අනුව රු.2,647,262ක වටිනාකමක් සහිත වාහන අනතුරු 05 ක තොරතුරු තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු වුවද, එම තොරතුරු විධිමත් පරිදි ඇතුළත් කර නොතිබුණි.

(ඈ) පොතෙන් කපාහැරීමේ තීරණයක් ගෙන නොතිබුණු වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයේ දැනට වාරික වශයෙන් අයවෙන රු.130,920ක වාහන අනතුරු අලාභ වටිනාකම 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ පොතෙන් කපා හැරීම පිළිබඳ ප්‍රකාශනයට (ඇමුණුම් (II)) ඇතුළත් කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සංචිත වාහනය 2020 වර්ෂයේ සිට විගණිත දින වූ 2025 ජූලි 18 දින දක්වා රු.1,500,000 කට ආසන්න පිරිවැයක් දරා අළුත්වැඩියා කොට තිබුණද 2025 ජූලි 18 දිනෙන් පසුව මෙම රථය භාවිතයෙන් ඉවත්කොට ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ අනාරක්ෂිතව ගාල්කර තිබුණි.

## 4.6 අනාර්ජික ගනුදෙනු

(අ) ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 12.54 වගන්තියටඅනුව, නිලධාරියෙකු ස්ථිර තනතුරක් දරන අතරතුර වෙනත් තනතුරක වැඩ බලන්නේ නම්, ඔහුට හිමිවිය යුත්තේ එම වැඩබලන තනතුරේ ආරම්භක වැටුපෙන් හතරෙන් පංගුවක් පමණක් වුවද වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩබලන ගණකාධිකාරී සහ හිටපු වැඩ බලන සහකාර සැලසුම් අධ්‍යක්ෂ යන නිලධාරීන්ට 2023 පෙබරවාරි සිට 2025 ජුනි දක්වා කාලය තුළ රු.156,102 ක මුදලක් වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ආයතන සංග්‍රහයේ vii වන පරිච්ඡේදයේ 12.5.4 වගන්තියට අනුව, නිලධාරියෙකු ස්ථිර තනතුරක් දරන අතරතුර තවත් තනතුරක වැඩ බලන්නේ නම්, ඔහුට ගෙවීම් කළ යුත්තේ අදාළ තනතුරු දෙකෙහිම රාජකාරි ඉටු කිරීමට නියමිත අවස්ථාවකදී, ඔහුගේ ස්ථිර තනතුරට හිමි සම්පූර්ණ වැටුප සමඟ වැඩ බලන තනතුරට හිමි ආරම්භක වැටුපෙන් හතරෙන් එකක කොටසක් ඔහුට ලබාදිය යුතු වුවද ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 12.5.4 වගන්තියේ විධිවිධානවලට පටහැනිව, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ බලන සහකාර සැලසුම් අධ්‍යක්ෂවරයා වෙත 2022 ජුනි 07 සිට 2025 මැයි 31 දක්වා කාලය තුළ රු.134,593 ක මුළු මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

## 4.7 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2026 ජනවාරි 07 දින අංක EPCG/TR/A/DST/2025/AQ-21 යටතේ "නිලනිවාස සම්බන්ධ විගණනය - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය", යන මාතෘකාව යටතේ නිකුත් කරන ලද විගණන විමසුම් සඳහා 2026 අප්‍රේල් 09 වන දින වන තෙක්ම ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළිතුරු ලබාදී නොතිබුණි.

## 4.8 කළමනාකරණ දුර්වලතා

(අ) මුදල් රෙගුලාසි 390 අනුව, චෙක්පත් පොත් දිනපතා ආරක්ෂිතව ලොකර් පද්ධතියක තැබිය යුතුය. ලබන්නාට අතින් භාර නොදුන් හෝ තැපැල් නොකළ චෙක්පත්ද එලෙසම ආරක්ෂිතව තැබිය යුතුය. එහෙත් රු.20,162,134 ක වටිනාකමකින් යුත් චෙක්පත් 97 ක්, මාසයකට වැඩි කාලයක් නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අනාරක්ෂිත ලෙස වවුචර් සමඟ අමුණා තිබුණි.

(ආ) වාහන 07 ක් සම්බන්ධව රු.5,427,784 ක වටිනාකමින් යුතු අලාභ හානි වෙනුවෙන් 1999 වර්ෂයේ සිට 2024 දක්වා වසර 25 ක් ගතවන තුරුද සිදුවූ වාහන අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඇ) සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව ප්‍රාදේශීය ලේකම් සඳහා උපලේඛනගත නිලනිවාස 02 ක් පවතින අතර ඉන් එකක් 2018 වර්ෂයේ ඉදිකර දැනට සමෘද්ධි කාර්යාලය පවත්වාගෙන යනු ලබයි. අනෙක් නිල නිවාසය දැනට අබලන් තත්වයේ පවතින බව හා එම නිලනිවස අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි තත්ත්වයේ පවතින අතර ප්‍රාදේශීය ලේකම්වරයා එම නිල නිවාසයේ පදිංචි වී නොතිබුණි.

(ඈ) සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් උපලේඛනගත නොවන අනෙකුත් නිලනිවාස 05 හා සෝමපුර සංචාරක බංගලාවේ ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු නොවන අතර එම ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරා ගැනීම සිදුකර නොතිබුණි.

(ඉ) නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කලමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ සේවය කල නිලධාරිණියක් රාජ්‍ය පරිපාලන හා කලමනාකරණ අමාත්‍යාංශයේ 2015 සැප්තැම්බර් 08 දිනැති ලිපිය අනුව, මෙම තනතුරට 2015 සැප්තැම්බර් 15 දින පත්කර තිබූ අතර රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්සභා හා පළාත්පාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PMAS/64473 හා 2023 අප්‍රේල් 10 දිනැති පත්වීම අවසන් කිරීමේ ලිපිය අනුව සේවය අවසන් කිරීමට කටයුතු කර තිබුණි. මෙම නිලධාරිනිය විසින් ව්‍යාජ විභාග ප්‍රතිඵල ඉදිරිපත් කර 2015 සැප්තැම්බර් 15 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා වශයෙන් රුපියල් 3,305,197 ක් ලබාගෙන තිබුණි. ඊට අමතරව ලබාගෙන තිබූ ආපදා ණය වල 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රුපියල් 205,650 ක්වූ අතර 2015 ඔක්තෝබර් 14 දින සිට 2016 පෙබරවාරි 25 දින දක්වා සම්පූර්ණ වැටුප් සහිතව ප්‍රසූත නිවාඩු හා 2019 අගෝස්තු 27 දින සිට 2019 සැප්තැම්බර් 05 දින දක්වා දින 10ක් දිවයිනෙන් බැහැර නිවාඩුද ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් අදාල නිලධාරියා හා නියමිත කාලයන්හි අධ්‍යාපන සුදුසුකම් වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි වූ වගකිව යුතු නිලධාරීන් සියල්ලද වගකීමට බැදෙන බව නිරීක්ෂණය විය.

(ඊ) තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ, ග්‍රාම නිලධාරී ලෙස සේවයේ නියුතුව සිටි නිලධාරියෙකු 2018 ජූලි 09 දින සිට වැඩ තහනමට ලක්ව සිටින අතර ඔහු රාජ්‍ය සේවයේ යෙදී සිටියදී ලබා ගෙන තිබූ ආපදා ණයවලින් රජයට ගෙවිය යුතු ණය ශේෂය රු.233,641 ක් විය. 2025 දෙසැම්බර් 31 දින වන විට වසර 07 ක කාලයක් ඉක්ම වූවද මෙම ණය ශේෂය අයකර ගෙන නොතිබුණි.

5 තිරසාර සංවර්ධනය

තිරසාර ඉලක්කයන් පිළිබඳ නිලධාරින් ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොතිබුණු අතර තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීම සිදුවී නොමැති නිසා සමාලෝචිත වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම පිළිබඳ ඇගයීමක් සිදු කර නොතිබුණි.

## 6. මානව සම්පත් කළමනාකරණය

### 6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂය අවසන් වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් නිලධාරී තනතුරු පුරප්පාඩු 17 ක්ද, තෘතියික මට්ටමට අයත් නිලධාරී තනතුරු පුරප්පාඩු 23 ක්ද, ද්විතියික මට්ටමට අයත් නිලධාරී තනතුරු පුරප්පාඩු 60 ක් හා ප්‍රාථමික මට්ටමට අයත් නිලධාරී තනතුරු පුරප්පාඩු 46 ක් වශයෙන් මුළු පුරප්පාඩු ප්‍රමාණය 146 ක්ව පැවතුණි.

එම්.පී.මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

එම්.පී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

## 04 පරිච්ඡේදය - කායර් සාධන දශර්ක

### 4.1. ආයතනයේ කායර් සාධන දශර්ක

**දිස්ත්‍රික් ලේකම් කායර්ාලය, ත්‍රිකුණාමලය**
**2025 වසරේ වාෂර්ික සැලැස්ම තුල අන්තගර්ත ඉලක්ක සපුරා ගැනීමේ කායර්සාධනය**

| අංකය | විශේෂ දශර්ක (හඳුනාගත් ප්‍රමුඛ මහජන සේවාවන් ) | අපේක්‍ෂිත වාෂර්ික ඉල්කක | සමුච්චිත ප්‍රගතිය | තත්‍ය ප්‍රතිඵල අපේක්ෂිත ප්‍රතිපලවල ප්‍රතිශතයක් ලෙස | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%-95% | 89%-75 % | 75%-50% | 50%-35% |
| 1 | උපත්, විවාහ, මරණ සහතික ලියාපදිංචිය | 168,474.00 | 166,167.00 | √ | | | |
| 2 | ජාති හැඳුනුම්පත් සඳහා අයදුම්පත් සකස් කිරීම | 15,197.00 | 14,022.00 | √ | | | |
| 3 | ඉඩම්බලපත්‍ර හා ඔප්පු සකස් කිරීම | 2,264.00 | 949.00 | | | | √ |
| 4 | ආදායම් බලපත්‍ර අලුත් කිරීම හා නිකුත් කිරීම | 81,621.00 | 80,695.00 | √ | | | |
| 5 | ගැබිණි මව්රුන් සඳහා පෝෂණ කූපන් නිකුත් කිරීම | 35,965.00 | 36,487.00 | √ | | | |
| | **සමස්ථ කායර්සාධනය** | **303,521.00** | **298,320.00** | | | | |

# 5. තිරසර සංවධර්න අරුමුණු (එස්ඩීජී) සපුරා ගැනීමේ කායර් සාධනය 2025

## 5.1. හඳුනා ගන්නා ලද අදාල තිරසර සංවධර්න අරමුණු දක්වන්න

| අංකය | ප්‍රධාන විෂය ක්ෂේත්‍රය | මූලික ක්‍රියාකාරම් | තිරසාර සංවධර්න වැඩසටහන | | ප්‍රතිදානය ( මූලික කායර් සාධන දශර්කය ) | | සාධන ලබාගැනීමේ ප්‍රගතිය% | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | තිරසාර සංවධර්න ඉලක්ක | අරමුණු | ප්‍රතිලාභීන් | සාධනය | 0-49 | 54-74 | 75-100 |
| 1 | පශු සම්පත් | එළුවන් සැපයීම | ති.ස.ඉ 1- දුප්පත් කම නැත<br>ති.ස.ඉ 2- ශුන්‍ය කුසගින්න | 1.2<br>2.3 | 50 | ග්‍රාමීය දරිද්‍රතාවය අඩු වීම: දරිද්‍රතා රේඛාව 25% කින් පහත වැටුණි; ගොවීන්ගේ ආදායම සහ වත්කම් හිමිකාරිත්වය වැඩි විය. | | √ | |
| 2 | ධිවර කමර්ාන්තය | දැල් මැසීම | ති.ස.ඉ 2- ශුන්‍ය කුසගින්න<br>ති.ස.ඉ 14- ජලයට යටින් ජීවිතය | 2.4<br>14.4 | 50 | වැඩිදියුණු කළ ආහාර සුරක්ෂිතතාව සහ ජලජ සම්පත් කළමනාකරණය | | √ | |
| 3 | පරිසරය | *ශ්‍රීපුර කසළ අංගනය සඳහා මායිම් බැම්ම<br>*ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය<br>*RO බලාගාරය | ති.ස.ඉ 6- පිරිසිදු වතුර සහ සනීපාරක්ෂාව<br>ති.ස.ඉ 11- තිරසර නගර හා ප්‍රජාවන්<br>ති.ස.ඉ 13- දේශගුණ ක්‍රියාකාරිත්වය | 6.1<br>11.6<br>13.1 | 4,500 | ජල ආරක්ෂාව- පානිය ජල හිගය 25%කින් අඩු කිරිම<br>ඔරොත්තු දිමේ හැකියාව- ආපදා වැලැක්වීම | | √ | |
| 4 | වනාන්තර හා වන ජීවි | භෝග ආරක්ෂා සඳහා වායු තුවක්කු සැලයීම | ති.ස.ඉ 2- ශුන්‍ය කුසගින්න<br>ති.ස.ඉ 15- ගොඩබිම ජීවිතය | 2.4,<br>15.1 | 2,200 | වනජීවී සහජීවනය -ගැටුම් කලාපවල අලි මිනිස් ආරවුල් 50%ක් තුරන් කෙරේ | √ | | |
| 5 | කමර්ාන්ත | *නිෂ්පාදන ගම්මාන<br>*සම් බැග් නිෂාපදනය<br>*එස්එම්ඊ සංවධර්නය<br>*කාන්තා ව්‍යවසායකත්වය යන්ත්‍රෝපකරණ සැපයීම | ති.ස.ඉ 5- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ය<br>ති.ස.ඉ 8- යහපත් රැකියා සහ ආථර්ික සංවධර්නය<br>ති.ස.ඉ 9- කමර්ාන්ත නවෝත්පාදන සහ යටිතල පහසුකම් | 5a<br>8.3<br>9.2 | 6,500 | ආථර්ික වධර්නය- සංචාරක ව්‍යාපාරායේ 5% ක වධර්නයක්<br>දේශිය ගොවින්ගේ ජිවනෝපය ශක්තිමත් කිරිම. | | √ | |
| 6 | අධ්‍යාපනය | ඊසීඩී වැඩසටහන දෙමව්පියන් පුහුණු කිරිම<br>පෙර පාසල් සහ ගුරු දීමනා පාසල් පෝෂණ | ති.ස.ඉ 4- ගුණාත්මක අධ්‍යාපනයක්<br>ති.ස.ඉ 1- දුප්පත් කම නැත | 4.2,<br>4.c,<br>1.4 | 10,000 | මානව ප්‍රාග්ධනය- සාක්ෂරතා අනුපාතය 2% කින් වැඩි විය (දිස්ත්‍රික්කය පුරා 95% ට ආසන්න වෙමින් තිබේ). | | √ | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැඩසටහන් සහ අලුත්වැඩියාව | | | | | | | |
| 7 | සෞඛ්‍ය | අපජල පවිත්‍රාගාරය<br><br>පෙර පාසල් දරුවන් සඳහා පෝෂණ සහාය<br><br>වකුගඩු ආබාධිත ගෙවීම්<br><br>මත්ද්‍රව්‍ය වැළැක්වීම | ති.ස.ඉ 3- යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම<br><br>ති.ස.ඉ 6- පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව | 3.4,3.5<br>6.3 | 12,000 | සෞඛ්‍ය සම්පන්න සමාජයක්: ළදරු මරණ අනුපාතය 10% කින් අඩු විය; පෝෂණ මට්ටම 25% කින් ඉහළ ගියේය | | √ | |
| 8. | සමාජ සේවය | අස්වැසුම ආබාධිත සහ වැඩිහිටි ගෙවීම් සාම වැඩසටහන් | ති.ස.ඉ 1- දුප්පත්කම නොමැත<br><br>ති.ස.ඉ 10- අසමානතා අඩු කිරීම<br><br>ති.ස.ඉ 16- සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන | 1.3<br>10.2<br>16.1 | 8,000 | ග්‍රාමීය දරිද්‍රතාවය අඩු වී ඇත. සමාජ ආරක්ෂණ ජාල ශක්තිමත් වී ඇත. | | √ | |
| 9 | සංස්කෘතිය | *සංස්කෘතික මධ්‍යස්ථානය<br><br>ඉදිකිරීම්<br><br>*විහරස්ථාන සංවර්ධනය<br><br>*මුස්ලිම් පල්ලිය අලුත්වැඩියා කිරීම | ති.ස.ඉ 16- තිරසාර නගර සහ ප්‍රජාවන් | 11.4 | 2,500 | සංරක්ෂිත උරුමයන් සංචාරක වර්ධනයට 5% ක දායකත්වයක් සපයයි. | | √ | |
| 10 | පළාත් පාලන | *වීදි අලෙවිකරුවන්ගේ සහාය<br><br>*කාර්යාල උපකරණ<br><br>*ආපදා ප්‍රතිචාර<br><br>*ඩිජිටල්කරණය<br><br>*රැකියා පොළ | ති.ස.ඉ 8- යහපත් රැකියා සහ ආර්ථික සංවර්ධනය<br><br>ති.ස.ඉ 16- සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන | 8.5<br>16.6 | 4,500 | සම්පත් කාර්යක්ෂමතාව: "ආරක්ෂිත භාවිතය" ප්‍රොටෝකෝල හරහා විදුලි අවශ්‍යතාවය 1% කින් අඩු කර ඇත. | √ | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | ජල සැපයුම සහ සනීපාරක්ෂාව | වැසිකිළි සහ නාන ස්ථාන<br>ජල පවිත්‍රකරණය<br>ජල සැපයුම සහ සම්බන්ධතා | ති.ස.ඉ 6-පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව<br><br>ති.ස.ඉ 3-යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම | 6.1<br>6.2<br>3.9 | 500 | "පිරිසිදු සමාජයක්" දැක්ම: රෝගවලින් තොර ජීවිතයක් වැඩිදියුණු කිරීම.ගම් මට්ටමින් පිරිසිදු රටක් නිමර්ාණය කිරීම. | | √ | |
| 12 | නිවාස | නැවත පදිංචි කළ පවුල් සඳහා නිවාස | ති.ස.ඉ 1-දුප්පත්කම නෙමැත<br><br>ති.ස.ඉ 11-තිරසාර නගර සහ ප්‍රජාවන් | 1.4<br>11.1 | 535 | මූලික අවශ්‍යතා සපුරාලීම; ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම. | | √ | |
| 13 | මාගර් සහ ප්‍රවාහනය | මාගර්, ජලාපවහන, බෝක්කු සහ පාලම් ඉදිකිරීම | ති.ස.ඉ 9 - කමර්ාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම්<br><br>ති.ස.ඉ 11 - තිරසාර නගර සහ ප්‍රජාවන් | 9.1<br><br>11.2 | 5,000 | තිරසාර යටිතල පහසුකම්: දුරස්ථ ප්‍රදේශ සඳහා මූලික අවශ්‍යතා සපුරාලීම සහ වැඩිදියුණු කළ සම්බන්ධතාවය. | | | |

**5.2. තිරසර සංවධර් ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහන හා අභියෝග සැකෙවින් විස්තර කරන්න**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වූ කලි ස්භාවික විපත් හා දිගුකාලයක් පැවැති යුද්ධය නිසා පසුගාමීව තත්වයට පත් වූ දිස්ත්‍රික්කයකි. සිවිල් පරිපාලනය හා සාමාන්‍ය ජන ජීවිතය යලි ස්ථාපිත කිරීමත් සමඟ, ඉතා සිග්‍රයෙන් දියුණුවන දිස්ත්‍රික්කයක් බවට එය පත් වී ඇත.

තිරසාර සංවධර්න ඉලක්කයන් ලඟාකර ගැනීම සමස්ථයක් ලෙස මෙම දිස්ත්‍රික්කයට අභියෝගයක් වන නමුත්, දිස්ත්‍රික්කයේ ප්‍රමුඛ අවශ්‍යතා හා තිරසාර සංවධර්න අරමුණු 17 හි ඇතුලත් කරුණුද සැලැකිල්ලට ගනිමින් දිස්ත්‍රික් කායර්ාලයේ සංයුක්ත සැලැස්ම සකස් කර ඇත.

ඉහත අනු ශිෂර් 4.1 හි විස්තර කර ඇති පරිදි සැලැසුම් කර තිබූ ඉලක්කයන්ගෙන් බොහොමයක් අපේක්ෂිත මට්ටමට ළඟාකර ගැනීමට හැකි වී ඇත. එමෙන්ම දිස්ත්‍රික් ඉලක්ක සම්පූණර් කර ගැනීම සඳහා තව බොහෝ දුර යාමට ඇත.

සාමාන්‍ය ජන ජීවිතයේ ඇති වන උච්චාවචන තත්ත්වයන්, ආථර්කයේ ඇති වන උච්චාවචනයන් මෙන්ම ත්‍රස්ථවාදි කටයුතු හා ස්වභාවික විපත් නිසා නීතිය හා සාමය පවත්වාගෙන යාමට ඇති වන බාධාවන් නිසා සැලැසුම් කළ කායර්යන් එහි උපරිමයෙන් ස්ථාපනය කිරීමට අපහසු මෙන්ම එහි ප්‍රතිඵල සැලසුම් කළ ආකාරයටම ළබා ගැනීම අභියෝගයක් ව පවතී.

**6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**

**6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑතුරු/අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 59 | 41 | 18 |
| තෘතීයික | 40 | 17 | 23 |
| ද්විතීයික | 1,022 | 962 | 60 |
| ප්‍රාථමික | 145 | 99 | 46 |
| | **1,266** | **1,119** | **147** |

**6.2. ආයතනයේ කාර්ය සාධන උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්යේ සමස්ථයක් ලෙස කාර්ය මණ්ඩයෙන් අනුමත මට්ටමට වඩා 147 ක ඌණතාවක් පවති. කාර්ය මණ්ඩලයේ හිගය වසර ගණනාවක් පවතින අතර නව පත්වීම් හරහා එම හිගය අඩු කර ගැනීමට හැකි යැයි අපේක්ෂා කෙරේ.

දිස්ත්‍රික්යේ සිවිල් ජනයා වෙත සිය සේවාන් ඉටු කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්රාල ආශ්‍රිතව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තෘතික මට්ටමේ නිලධාරී ඌණතාවය දැඩිව බලපා ඇත. දැනට සිටින තත්‍ය කාර්ය මණ්ඩලයට සමානුපාතිකව ජ්‍යෙෂ්ඨ හා තෘතික මිට්ටමේ නිලධාරීන්ගේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 58 ක් හා 41 ක මට්ටමක පවතී. මෙම තත්වය දෛනික පරිපාලන තත්තවයට දැඩිව බලපානු ඇත.

## 6.3. මානව සම්පත් සංවධර්නය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ථ ආයෝජනය (රු) | | වැඩසටහනේ ස්භාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| පිළුල් කාණ්ඩයේ නිලධාරින් සඳහා වු පුහුණු වැඩසටහන | 102 | පැය 12 | 142,592.89 | - | දේශීය | *පත්වීම සහ නිවාඩු පිළිබඳ මූලික කරුණු,<br><br>*රජයේ නිලධාරීන්ගේ සාමාන්‍ය හැසිරීම සහ විනය, ඵලදායී සන්නිවේදන කුසලතා සහ ආචාර ධමර්.<br><br>*කුසලතා සහ සමාජ සම්බන්ධතාවය<br><br>*කායර්ාල පද්ධති සහ කායර්ාල කළමනාකරණය |
| රාජ්‍ය කළමණාකරන සේවා නිළධාරි සහ සංවධර්න නිලධාරින් සඳහා වු පුහුණු වැඩසටහන | 62 | පැය 12 | 179,454.00 | - | දේශීය | විනය ක්‍රියා පටිපාටිය සහ විමශර්න ක්‍රියා පටිපාටිය |

**ආයතනයේ කායර් සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද කෙටියෙන් පැහැදිලි කරන්න**

දිස්ත්‍රික් ලේකම් කායර්ාලයේ ස්ථාපනය කර ඇති දිස්ත්‍රික් කුසලතා සංවධර්න ඒකකය මගින් දිස්ත්‍රික් ලේකම් කායර්ායේ හා ප්‍රාදේශීය ලේකම් කායර්ාවල දැනට සිටින කායර් මණ්ඩලයේ හා අලුතින් එක්වන කායර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා, ආකල්ප සහ නිපුණතා වැඩිදියුණු කිරීම සිදු කරනු ලබයි. සේවකයන්ගේ දෛනික සේවා සැපයීම සඳහා අවශ්‍ය වන සීමිත සහ තෝරා ගත් ක්ෂේත්‍රවල මූලික පුහුණු ලබාදීම සිදු කරනු ලබයි. මෙය දිස්ත්‍රික් ලේකම් කායර්ාග හා ප්‍රාදේශිය ලේකම් කායර්ාවල සේවකයන්ගේ සේවා ඵලදායි බව ඉහළ නැංවීම සඳහා බෙහෙවින් උපකාරී වී ඇත.

එමෙන්ම නැගෙනහිර පළාත් සභාවේ හා දිස්ත්‍රික්කයේ ඇති වෙනත් දෙපාතර්මේන්තු වල කායර්ය මණ්ඩලය ද මේ සඳහා සඳහා සහභාගි වේ.

මේ වන විට බොහොමයක්ම රාජ්‍ය සේවා ලබාදීමේ ක්‍රම වේද නව තාක්‍ෂණය සමඟ සමපාතව ඇති නිසා සෑම කායර්ය මණ්ඩලයේ අයකුම එම දැනුම ලබාගැනීම අනිවායර්ය කර ඇත. එමෙන්ම භාෂා කුසලතා ලබැගැනීම, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය සහ වෙනත් රැකියාව සම්බන්ධ දැනුම පුහුණුව ලබා ගැනීම ප්‍රමුඛ අවශ්‍යතාවක් කොට සලකනු ලැබේ. මෙමගින් අවසාන වශයෙන් අපේක්‍ෂා කරනුයේ රාජ්‍ය සේවාවේ ඵලදායි බව ඉහළ නැංවීමයි.

## 07. පරිච්ඡේදය අනුකූලතා වාතර්ාව

| අදාල කරගතයුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල කොවීමට කෙටි පැහැදිළි කිරීම | අනනුකූලබව වලක්වා ගැනීමට ක්‍රියාමගර් |
|---|---|---|---|
| **1. පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම්** | | | |
| 1.1. වාෂර්ික මුල්‍ය ප්‍රකාශ | අනුකූලවේ | | |
| 1.2. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූලවේ | | |
| 1.3. ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | | |
| 1.4. ගබඩා අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | | |
| 1.5. විශේෂ අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | | |
| 1.6. වෙනත් | අදාල නොවේ | | |
| **02. පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1.රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/218 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන් කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.2. පුද්ගල පඩිනඩි ලේඛනය/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.3. විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.4. අභ්‍යන්තර විගණන වාතර්ා ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.5. සියළුම මාසික ගිණුම් සාරාංශ (සිගාස්) පිළියෙළ කර නියමිත දිනට මහ භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 2.6. චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.7. ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.8. තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.9. හානි/පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.10. බැරකම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.11. උප පත්‍රිකා පොත් ලේඛනය (ජීඒ - එන්20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |

| | | | |
|---|---|---|---|
| **03. මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1. මූල්‍ය බලතල ආයතනය තුල පවරා දි තිබීම | අනුකූලවේ | | |
| 3.2. මූල්‍ය බලතල පවරා දීම ආයතනය තුල පවරා දි තිබීම | අනුකූලවේ | | |
| 3.3. සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූලවේ | | |
| 3.4. 2014.05.11 දිනැති අකං 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රාජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත් ව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| **04. වාෂරීක සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1. වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.2. වාෂරීක ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීම | අනුකූලවේ | | |
| 4.3. වාෂරීක අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.4. වාෂර්ක අයවයැ ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාතර්මේන්තුව වෙත ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| **5. විගණන විමසුම්** | | | |
| 5.1. විගණකාධිපතිවරයා විසින් නියමිත කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූලවේ | | |
| **06. අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1. මු.රෙ. 134 (2), DMA/1-2019, අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 6.2. සෑම අභ්‍යන්තර විගණන වාතර්ාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම | අනුකූලවේ | | |
| 6.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(04) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාතර්ාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාතර්මේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 6.4. මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර වාතර්ාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **07. විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1. ඩීඑම්ඒ චක්‍රලේඛ 01- 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කට්ටු 4ක් වත් අදාල වෂර්ය තුල පවත්වාගෙන තිබීම | අනුකූලවේ | | |
| **08. වත්කම් කළමනාකරණය** | | | |
| 8.1. අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු | අනුකූලවේ | | |

| | | | |
|---|---|---|---|
| කොම්ප්ට්‍රෝලර් ජනරල් කායර්ාලය වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| 8.2. ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කායර්ාලය වෙත යොමු කිරීම | අනුකූලවේ | | |
| 8.3. රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව භාන්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාතර්ා නියමිත දිනට විගණකාධිපත්වරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 8.4. වාෂර්ික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිදෙර්ශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම | අනුකූලවේ | | |
| 8.5. ගහරීත භාණ්ඩ අපහරණය කිරීම මු.රේ.772 අනුව සිදු කිරීම | අනුකූලවේ | | |
| **09.** වාහන කළමනාකරණය | | | |
| 9.1. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාතර්ා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 9.2. වාහන ගහරීත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූලවේ | | |
| 9.3. වාහනයේ ලොග් පොත් පවත්වා ගනිමින් යාවත්කාලීක කර තිබීම | අනුකූලවේ | | |
| 9.4. සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| 9.5. 2016-12-29 දිනැති අංක 2016-/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා | අනුකූලවේ | | |
| 9.6 කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූණර් අයිතිය පවරාගෙන තිබීම | අදාල නොවේ | | |
| **10.** බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1නියමිත දිනට බැංකු සැසදුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 10.2. සමාලෝචිත වෂර්යේදී හෝ ඊට පෙර වෂර්වල ඉදිරියට ගෙන අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| 10.3. බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| **11.** ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 සලසා තිබුණු ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූලවේ | | |

| | | | |
|---|---|---|---|
| 11.2. මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු වෂර් අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූලවේ | | |
| **12. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1. සීමාවන් වලට අනුකූල වීම | අනුකූලවේ | | |
| 12.2. හිග හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරීම | අනුකූලවේ | | |
| 12.3. වෂර්යකට වැඩි කාලයක් සිට පැවත එන හිග හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| **13. පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1. කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූලවේ | | |
| 13.2. පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| **14. අග්‍රිම ගිණුම** | | | |
| 14.1. සමාලෝචිත වෂර්ය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාතර්මේන්තුය වෙත ප්‍රේෂණය කර තිබීම | අනුකූලවේ | | |
| 14.2. මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කායර් අතුරු අග්‍රිම, එම කායර්ය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| 14.3. මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කායර් අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූලවේ | | |
| 14.4. අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූලවේ | | |
| **15. ආදායම් ගිණුම** | | | |
| 15.1. අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූලවේ | | |
| 15.2. රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම | අනුකූලවේ | | |
| 15.3. මු.රෙ. 176 අනුව හිග ආදායම් වාතර්ා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **16. මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1. අනුමත කායර් මණ්ඩල සීමාව තුල කායර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 16.2. කායර් මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූලවේ | | |
| 16.3. 20.09.2017 දිනැති එම්එස්ඩී චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාතර්ා කළමනාකරණ සේවා දෙපාතර්මේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **17. මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |

| | | | |
|---|---|---|---|
| 17.1. තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු ලබාදීමේ නිලධාරියකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 17.2. ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා පබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාගර් හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රසංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූලවේ | | |
| 17.3. තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාතර්ා ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| **18. පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභි ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම | අනුකූලවේ | | |
| 18.2. එම චක්‍රලේඛයේ 2.3. ඡේදය පරිදි පුරවැසි/සේවාලාභි ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්‍ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූලවේ | | |
| **19. මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1. 2018-01-24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්ම සකස්කොට තිබීම | අනුකූලවේ | | |
| 19.2. කායර් මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වෂර්යකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සංවධර්න සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූලවේ | | |
| 19.3. ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කායර්ය මණ්ඩලය සඳහාම වාෂර්ක කායර් සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූලවේ | | |
| 19.4. ඉහත චක්‍රලේඛයේ 6.5. ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවධර්න සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවධර්න වැඩසටහන් සංවධර්නය කිරීම, නිපුණතා සංවධර්න වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර තිබීම | අනුකූලවේ | | |
| **20. විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1. ඉකුත් වාෂර් සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරිදි කොට තිබීම | අනුකූලවේ | | |